සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම

# වාර්ෂික වාර්තාව
# 2023

27, මෙල්බෝර්න් ඇවනිව්, කොළඹ 4, ශ්‍රී ලංකාව
දුරකථන: +94 11 2584184 ෆැක්ස්: +94 11 250 0674
ඊ මේල් : infosugarsrilanka@gmail.com

# මිහිරි සඵලත්වය

## සඳහා සාරවත් බවින් පොහොසත් වීම



# අන්තර්ගතය

| | |
|---|---|
| අපගේ දර්ශනය, දැක්ම, අරමුණු, ක්‍රමෝපායන්, පර්යේෂණ සහ සංවර්ධනය සංස්ථානික සමාජ වගකීම් | 4 |
| මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුවීම් | 6 |
| සභාපතිතුමාගේ ප්‍රකාශය | 8 -9 |
| අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශය | 10 |
| ආයතනික පාලන වාර්තාව | 11 |
| ආයතනික සමාජීය වගකීම් වාර්තාව | 12 |
| අවදානම් කළමනාකරණය | 13 |
| අපගේ සංස්කෘතිය සහ සාරධර්ම | 15 |
| විගණන කමිටුවේ වාර්තාව | 16 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 18 - 19 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ ආයතනික ව්‍යුහය | 21 - 26 |
| විගණකාධිපති වාර්තාව | 27 - 35 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 36 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 37 |
| ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය | 38 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 39 |
| මූල්‍ය ප්‍රකාශන වලට සටහන් | 40 - 60 |
| ඛණ්ඩ වශයෙන් මූල්‍ය තොරතුරු- සෙවනගල සහ පැල්වත්ත | 61 - 68 |
| දස වර්ෂ සාරාංශය | 69 |
| තිරසාරභාවය පිළිබද වාර්තාව | 70 |
| ප්‍රස්ථාරික ඛණ්ඩ තොරතුරු සැසඳීම - සෙවනගල සහ පැල්වත්ත | 71 |
| ප්‍රගති වාර්තාව | 72 - 75 |
| සංස්ථනික තොරතුරු | 76 |

## අපගේ දර්ශනය

ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණුකිරීමෙන් ජාතික සංවර්ධනයට දයක වීම තුලින් සීනි මත පදනම්වූ ගොවිතැන් සහ කර්මාන්ත හරහා ගොවීන්ගේ ප්‍රජා ආර්ථික තත්වය උසස් කිරීම

## අපගේ දැක්ම

සීනි සැපයුමින් ස්වයංපෝෂිත වීම

## අපගේ අරමුණු

**මෙහෙවර 333 - කෙටිකාලීන (2026 තෙක් වසර 3 කට)**

1) මෙට්‍රි ක් ටොන් 57,600 ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවි පවුල් 16,000 කට උපකාර කිරීම.
3) වක්‍ර රැකියා 56,000 ක් සැපයීම.
4) ජාතික සීනි අවශ්‍යතාවට 9.6% ක් දායක වීම.
5) රු.බිලියන 5.7 ක ශුද්ධ ලාභයක් සාක්ෂාත් කරගැනීම.
6) රු.බිලියන 11 ක විදේශ විනිමයක් ඉතිරි කරගැනීම.
7) සමගාමීව මෙගාවොට් 46 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

**මෙහෙවර 555 - දිගුකාලීන (2028 තෙක් වසර 5 කට)**

1) මෙට්‍රික් ටොන් 66,300 ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවි පවුල් 20,000 කට උපකාර කිරීම.
3) වක්‍ර රැකියා 60,000 ක් සැපයීම.
4) දේශීය සීනි අවශ්‍යතාවෙන් 11% ක් නිෂ්පාදනය කිරීම.
4) රු.බිලියන 7.6 ක ශුද්ධ ලාභයක් සාක්ෂාත් කරගැනීම.
5) රු.බිලියන 13 ක විදේශ විනිමයක් ඉතිරි කරගැනීම.
6) සමගාමීව මෙගාවොට් 60 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

## උපාය මාර්ග

1) වගාකරන්නා මත පදනම්වූ අපගේ වගා මාදිලිය උසස් ප්‍රතිඵල ලැබෙන ව්‍යාපාර හවුල්කරුවා සඳහාය.
2) වැඩි ඵලදවක් ලබාදෙන ප්‍රභේදයන්, කාර්යක්ෂම ව්‍යාප්ත සේවාවක් සහිත වඩා හොඳ කෘෂිකාර්මික පරිචයන් භාවිතා කරමින් ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ලබාදීම තහවුරු කිරීම.
3) ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ඵලදයිතාවය සඳහා දිරිගැන්වීම් ලබා දීමෙන් ගොවීන් අභිප්‍රේරණය කිරීම
4) ඵලදයිතාව හා කාර්යසාධනය පදනම් කරගත් දිරිගැන්වීම් මඟින් කාර්යමණ්ඩලය අභිප්‍රේරණය කිරීම.

## පර්යේෂණ සහ සංවර්ධනය

ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනය සමඟ එක් වී උක්වගාව සහ සීනි ඵලදායිතාව වැඩිකිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකරමින් පවතී.

## සංස්ථනික ප්‍රජා වගකීම්

උක් වගාවේ නියුතු ගොවීන්ගේ ආදයම් අගයන් වැඩිකර, අපගේ මෙහෙයුම් දියත් කරන ප්‍රජාව සහ පරිසරය තුලට අගයන් එකතු කර යුතු බව අපගේ විශ්වාසයයි.







සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුවීම් - 2023

| (අගයන් රුපියල් මිලියන වලින් දැක්වේ) | 2023 | 2022 | 2021 |
|---|---|---|---|
| **මූල්‍යමය ඉස්මතු කිරීම්** | | | |
| පිරිවැටුම | 16,095.08 | 19,287.05 | 12,285.07 |
| විකුණුම් පිරිවැය | (10,514.18) | (10,550.15) | (8,980.76) |
| දළ ලාභය (අලාභය) | 5,580.90 | 8,736.90 | 3,304.31 |
| බදු වලට පෙර ශුද්ධ ලාභය (පාඩුව) | 2,835.11 | 6,045.57 | 1,250.58 |

| **මෙහෙයුම් කාර්යසාධනය** | 2023 | 2022 | 2021 |
|---|---|---|---|
| **ඉඩම් වගාව** | | | |
| වගාකල හැකි බිම් ප්‍රදේශය (හෙක්ටෙයාර්) | 14,536 | 14,760 | 14,874 |
| වගාකල බිම් ප්‍රදේශය (හෙක්ටෙයාර්) | 12,722 | 13,493 | 13,820 |
| වගාකල බිම් ප්‍රදේශයේ ප්‍රතිශතය | 87% | 91% | 93% |

| **අස්වනු වැඩසටහන** | 2023 | 2022 | 2021 |
|---|---|---|---|
| ලබාගත් උක් අස්වැන්න (මෙට්‍රික් ටොන්) | 646,805 | 767,572 | 791,288 |
| පසුගිය වසරට සාපේක්ෂව වැඩිවීම / අඩුවීම | -16% | -3% | 38% |
| සීනි ලබාගැනීමේ අනුපාතය | 6.59% | 6.33% | 6.09% |

| **සීනි නිෂ්පාදනය** | 2023 | 2022 | 2021 |
|---|---|---|---|
| **නිෂ්පාදනය - මෙට්‍රික් ටොන්** | 41,860 | 36,738 | 48,177 |
| **එක් පුද්ගල නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)** | 7.51 | 6.64 | 8.75 |

| **මානව සම්පත්** | 2023 | 2022 | 2021 |
|---|---|---|---|
| ස්ථිර | 4,265 | 3,709 | 3,549 |
| කොන්ත්‍රාත් පදනම | 455 | 517 | 445 |
| අනියම් | 819 | 1,276 | 1,498 |
| වාරික හෙවත් කාලීන | - | - | - |
| පුහුණුවන්නන් | 32 | 30 | 15 |
| මුළු ගණන | 5,571 | 5,532 | 5,507 |


මිහිරි සාර්ථකත්වය ලෙස
ආකාශයට ළඟාවීම

# සභාපතිතුමාගේ ප්‍රකාශය



2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමග සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ 2023 වාර්ෂික වාර්තාව, අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම සතුටින් ඉදිරිපත් කරමි.

සමාලෝචිත වර්ෂයේදී කාර්සාධනයට බලපෑ සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථීක විද්‍යාත්මක සාධක රාශියක අභියෝගවලට මුහුණදීමට සිදුවිය. සීනි උකහාගැනීමේ අනුපාතය 6.33% සිට 6.59% දක්වා වැඩි විය. නමුත් උක්වගා එළදාව හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 61.21 සිට මෙට්‍රික් ටොන් 50.84 දක්වා නිෂ්පාදන පරිමාවට රිනාත්මක බලපෑමක් සිදු කරමින් සැලකියයුතු ලෙස අඩු විය.

**ආර්ථීක පරිසරය**

2022 දී නිරීක්ෂණය කළ සියයට 7.3 ක සැලකිය යුතු හැකිලීමට සාපේක්ෂව 2023 දී, ශ්‍රී ලංකා ආර්ථීකය සියයට 2.3 ක මධ්‍යස්ථ හැකිලීමක් සමඟ නැවත යථා තත්වයට පත්වෙන ලකුණු පෙන්නුම් කළේය. විශේෂයෙන් වසරේ දෙවන භාගයේදී ක්‍රමයෙන් නමුත් ස්ථාවර ප්‍රකෘතිමත් වීම 2023 දී පැහැදිලි විය, එම කාලය තුළදී දළ දේශීය නිෂ්පාදිතය (GDP) ධනාත්මක වර්ධන වේගයන් වාර්තා කළේය. උද්ධමනය ලිහිල් කිරීම සහ බාහිර අංශයේ පීඩනය ලිහිල් කිරීම මධ්‍යයේ නව සාර්ව ආර්ථික ස්ථායීතාවය මෙයට යටින් යටින් දිව යයි.

**දළ කර්මාන්ත විශ්ලේෂණය**

වසරින් වසර පදනම මත ගල් ඔය, සෙවනගල, පැල්වත්ත සහ ඇතිමලේ කර්මාන්තශාලා 2022 වර්ෂයේ වාර්තා කල මෙට්‍රික් ටොන් 78,857 ට සාපේක්ෂව සියයට 16.2 ක සංකෝචනයක් සමග මෙට්‍රික් ටොන් 66,013 ක සීනි නිෂ්පාදනයක් 2023 දී වාර්තා කළේය.

වර්ෂය තුළ කර්මාන්තශාලා හතර විසින් කළමනාකරණය කරන ලද උක් වගාවේ මුළු ප්‍රමාණය හෙක්ටයාර 26,638 කි. මේ අතර, උක් වගාව සඳහා අවශ්‍ය පෝෂක හිඟය පිළිබිඹු කරමින් සීනි කර්මාන්තශාලා හතරේ සාමාන්‍ය අස්වැන්න සියයට 8කින් අඩු විය. ඒ අනුව, සාමාන්‍ය අස්වැන්න 2022 දී වාර්තා වූ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 59.7 ට සාපේක්ෂව 2023 දී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 54.9 ක් විය. අඹරන ලද මුළු උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,010,867 ක් වූ අතර සමස්ත සීනි උකහාගැනීමේ අනුපාතය වර්ෂය සඳහා 6.54% ක් විය. වසර තුළ එතනෝල් නිෂ්පාදනය ලීටර් මිලියන 13.35 ක් විය.

**ආර්ථීක පරිසරය**

2022 දී නිරීක්ෂණය කළ සියයට 7.3 ක සැලකිය යුතු හැකිලීමට සාපේක්ෂව 2023 දී, ශ්‍රී ලංකා ආර්ථීකය සියයට 2.3 ක මධ්‍යස්ථ හැකිලීමක් සමඟ නැවත යථා තත්වයට පත්වෙන ලකුණු පෙන්නුම් කළේය. විශේෂයෙන් වසරේ දෙවන භාගයේදී ක්‍රමයෙන් නමුත් ස්ථාවර ප්‍රකෘතිමත් වීම 2023 දී පැහැදිලි විය, එම කාලය තුළදී දළ දේශීය නිෂ්පාදිතය (GDP) ධනාත්මක වර්ධන වේගයන් වාර්තා කළේය. උද්ධමනය ලිහිල් කිරීම සහ බාහිර අංශයේ පීඩනය ලිහිල් කිරීම මධ්‍යයේ නව සාර්ව ආර්ථික ස්ථායීතාවය මෙයට යටින් යටින් දිව යයි.

**දළ කර්මාන්ත විශ්ලේෂණය**

වසරින් වසර පදනම මත ගල් ඔය, සෙවනගල, පැල්වත්ත සහ ඇතිමලේ කර්මාන්තශාලා 2022 වර්ෂයේ වාර්තා කල මෙට්‍රික් ටොන් 78,857 ට සාපේක්ෂව සියයට 16.2 ක සංකෝචනයක් සමග මෙට්‍රික් ටොන් 66,013 ක සීනි නිෂ්පාදනයක් 2023 දී වාර්තා කළේය.

වර්ෂය තුළ කර්මාන්තශාලා හතර විසින් කළමනාකරණය කරන ලද උක් වගාවේ මුළු ප්‍රමාණය හෙක්ටයාර 26,638 කි. මේ අතර, උක් වගාව සඳහා අවශ්‍ය පෝෂක හිඟය පිළිබිඹු කරමින් සීනි කර්මාන්තශාලා හතරේ සාමාන්‍ය අස්වැන්න සියයට 8කින් අඩු විය. ඒ අනුව, සාමාන්‍ය අස්වැන්න 2022 දී වාර්තා වූ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 59.7 ට සාපේක්ෂව 2023 දී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 54.9 ක් විය. අඹරන ලද මුළු උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,010,867 ක් වූ අතර සමස්ත සීනි උකහාගැනීමේ අනුපාතය වර්ෂය සඳහා 6.54% ක් විය. වසර තුළ එතනෝල් නිෂ්පාදනය ලීටර් මිලියන 13.35 ක් විය.

රජය දේශීය සීනි අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආනයන මත අධිකව යැපීම අවම කර ගන්නා අතර දේශීය සීනි කර්මාන්තය ශක්තිමත් කිරීම ඉලක්ක කරමින් පියවර කිහිපයක් ගැනීමට කටයුතු කරන ලදී. දේශීය සීනි නිෂ්පාදනය වර්ධනය කිරීම පිණිස වගා ඉඩම් ප්‍රමාණය පුළුල් කිරීම සහ කර්මාන්තශාලා ධාරිතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඉහල ප්‍රමුඛතාවයන් ලෙස සැලකිල්ලට ගනිමින්, ලංකා සීනි (පුද්) සමාගමේ අනුබද්ධිත සමාගමක් ලෙස වේලි ඔය සීනි කර්මාන්තශාලාව නමින් නව සීනි කර්මාන්තශාලාවක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2022 මුල් අවදියේදී අනුමැතිය ලබා දී ඇත. එමගින් දේශීය සීනි නිෂ්පාදනය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

**සමාගමේ කාර්යසාධනය**

සෙවණගල සීනි කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය 2023 දී මෙට්‍රික් ටොන් 13,783 ක් දක්වා සියයට 9 කින් වැඩි වූ අතර පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය 2023 දී මෙට්‍රික් ටොන් 28,077 ක් දක්වා සියයට 16.4 කින් වැඩි විය. සමස්ත ජාතික නිෂ්පාදනයට ලංකා සීනි සමාගමේ සීනි නිෂ්පාදනයේ ඇස්තමේන්තුගත කොටස 2022 වසරේ වාර්තා වූ සියයට 46.6 ට සාපේක්ෂව 2023 වසරේ සියයට 63.4 කි. එතනෝල් නිෂ්පාදනය 2022 වසරේ ලීටර් 11,790,195 සිට 2023 වසරේ ලීටර් 7,521,979 දක්වා අඩු වී ඇත.

**සුභසාධනය**

සමාගම වර්ෂය තුළදී සැලකිය යුතු මුදලක් සුභසාධනය වෙනුවෙන් වැයකරන ලදී. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා වෙනම නඩත්තු කාර්ය මණ්ඩලයක් වෙන්කරන ලදී. සමාගම විසින් සේවක පවුල් වල දරුවන් සඳහා පාසල් ප්‍රවාහන සේවාවක් සපයා ඇත. පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සමාගම විසින් පවත්වාගෙන යන ලදී.

**අනාගත මුහුණුවර**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්තමානයේදී අර්බුදකාරී තත්වයක පවතී. එහෙත් රජය විසින් දුඹුරු සීනි සහ එතනෝල් මත ආනයන සීමා පනවා ඇත. එමගින් දේශීය නිෂ්පාදකයින් මුහුණ දෙන තරගකාරිත්වය අඩුවන බැවින් සහ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ආකර්ශණීය මිලක් හිමිවෙන බැවින් දේශීය සීනි කර්මාන්තයට සුබදායි ප්‍රතිපල ජනනය කරනු ලබයි. අපගේ නිෂ්පාදිතයට නිශ්චිත වෙළඳපොලක් ඇත. කළමනාකාරිත්ව අඛණ්ඩව උක් වගා බිම් වැඩිකිරීමට ඉලක්ක කරයි. දැනට සිටින ගොවීන් අභිප්‍රේරණය කිරීමෙන් හා කර්මාන්තයට නව ගොවීන් ගෙන ඒමෙන් හොඳ ප්‍රතිඵල අත්කර ගැනීමට බලාපොරොත්තු වෙමු.

නව ඉඩම් අත්පත්කරගැනීම හා අප වගාවේ ඵලදායිතාව වර්ධනය කිරීමද වැදගත් වේ. ප්‍රධාන නිෂ්පාදනයට අමතරව මෙහෙයුම්වලින් උපරිම ඵල නෙලාගැනීමට අතුරු නිෂ්පාදන වර්ධනය කිරීම ඉලක්ක කළෙමු.

**ස්තුතියි**

අධ්‍යක්ෂ මණ්ඩලයට, කළමනාකාරීත්වයට සහ සමාගමේ කාර්ය මණ්ඩලයට 2023 සහ ඊට පෙර වර්ෂවලදී ලබාදුන් උත්සහාය හා වටිනා දායකත්වය සම්බන්ධයෙන් මාගේ ගෞරව පූර්ව ස්තුතිය සටහන් කර තැබීමට කැමැත්තෙමි.

තවද පසුගිය කාලය පුරාම සමාගම සමඟ සිටි උක් වගාකරුවන්, ගනුදෙනුකරුවන්, සීනි තොග වෙළඳුන්, බැංකු සහ රාජ්‍ය ආයතන වලටද මාගේ ස්තුතිය පුද කරමි.

**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එස්.එම්.එස්.පී.බී සමරකෝන් RWP, RSP**
සභාපති

# අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශය



හිතවත් සියලුම ඇල්මැති පාර්ශවකරුවනි,

**ව්‍යාපාර පරිසරය**

2023 වර්ෂය මුල්‍ය තත්වයට ධනාත්මක බලපෑමක් කරමින් සමාගමට සතුටුදායක ප්‍රතිපල ජනනය කරන ලදී. වර්ෂය තුල පැවති පොහොර සහ අනෙකුත් අමු ද්‍රව්‍ය හිගය ලිහිල් වීමත් සමග සීනි නිෂ්පාදනය මෙ. ටො. 5,122 කින් වැඩි විය. නමුත් මිල වැඩිවීමත් සමග රට තුල මත්පැන් සඳහා ඉල්ලුම තියුණු ලෙස පහල වැටීම හේතුවෙන් එතනෝල් සඳහා ඇති ඉල්ලුමද දැඩි ලෙස අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ස්ප්‍රිතු නිෂ්පාදනය ලීටර් 4,268,216 කින් වර්ෂය තුලදී අඩු විය. වසර තුළදී සීනි කිලෝ ග්‍රෑම් එකකට රු.312 ක සහ, ස්ප්‍රිතු ලීටරයකට රු. 872.67 ක සාමාන්‍ය විකුණුම් මිලක් පවත්වාගෙන යාමට සමාගමට හැකි විය. සලකා බලන මුල්‍ය වර්ෂයේ සමාගම පසුගිය වර්ෂයේ වාර්තා කරන ලද රු. මිලියන 19,287 ට සාපේක්ෂව රු. මිලියන 16,095 ක අදායමක් වාර්තා කරන ලදී. සමාගම 2023 වර්ෂය සඳහා රු. මිලියන 2,835 ක බදු පෙර මෙහෙයුම් ලාභයක් වාර්තා කල අතර එය 2022 වර්ෂයේ වාර්තා කල බදු පෙර මෙහෙයුම් ලාභය වන රු. මිලියන 6,045 හා සැසඳීමේදී තියුණු පහළ යෑමකි. එතනෝල් විකුණුම් පහත වැටීම වර්ෂයේ ලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන් දායක විය. වර්ෂය තුල විකිණුම් පිරිවැය රු. මිලියන 10,514 ක් විය. පරිපාලන වියදම් රු. මිලියන 214 කින් රු. මිලියන 3,566 දක්වා වැඩි විය. මුල්‍ය අදායම රු. මිලියන 115 කින් රු. මිලියන 656 දක්වා වැඩි වූ අතර මුල්‍ය වියදම රු. මිලියන 18 කින් රු. මිලියන 69 දක්වා අඩු විය.

**තාක්ෂණික** (Technical)

සමාගමේ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා කර්මාන්තශාලා ධාරිතාව වැඩි කිරීම සඳහා කර්මාන්තශාලාව පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් කළමනාකාරිත්වය විසින් ආරම්භ කර ඇත. රුපියල් මිලියන 129 ක වියදමින් ඒකාබද්ද මෘදුකාංග විසඳුමක් (ERP System) ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. එමගින් ආයතනයේ ව්‍යාපාර ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ සපළුධායිත්වය වර්ධනය කිරීමට සහ යාවත්කාලින තොරතුරු සහ වාර්තාකරණ හැකියාවන් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. උක් නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉතිරි වන ද්‍රව්‍ය යොදා ගෙන ජෛව පොහොර නිෂ්පාදන කර්මාන්තශාලාවක් රුපියල් මිලියන 1,433 ක වියදමින් ඉදිකිරීම සමාගම විසින් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් රසායනික පොහොර ආනයන වියදම රුපියල් මිලියන 350 කින් අඩු කිරීම, හරිත ආර්ථික සංස්කෘතියක් ඇතිකිරීම, අපද්‍රව්‍ය වඩාත් පරිසර හිතකාමී ලෙස ප්‍රයෝජනයට ගැනීම, රසායනිකයන්ගෙන් තොර පොහොර භාවිතා කිරීම සහ හරිත ශක්ති පාරිභෝජන සංකල්ප භාවිතා කිරීම තුලින් පසේ තත්වය වර්ධනය කිරීම වැනි ප්‍රතිලාභ රාශියක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ.

**මානව සම්පත**

සමාගමේ සාර්ථකත්වය පදනම වන්නේ එහි සේවකයින්ය. සමාගමේ සේවකයින් සමාගමේ වටිනාකම් සමඟ හසුරුවනු ලබන අතර ආරක්ෂාව, අපගේ සේවකයින්, ගනුදෙනුකරුවන්, විශිෂ්ඨත්වය, අවංකභාවය, කල්පැවැත්ම සහ අපගේ ප්‍රජාව කෙරෙහි අවධානය යොමු කෙරේ. පුහුණුව හා සංවර්ධනය, ඉතාමත් වටිනා සම්පත වන මනාව සම්පත රඳවා ගැනීමට සහ දියුණු කිරීමට ප්‍රධාන මෙවලම වේ. මෙයට අපගේ ගොවීන්ද ඇතුලත් වේ. එබැවින්, විධිමත් පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂවලදී පවත්වාගෙන යාම කළමනාකාරීත්වයේ පරම ප්‍රමුඛත්වය වී ඇත.

සියලුම සේවකයන්ට හා කළමනාකාරීත්වයට ඔවුන්ගේ කැපවීම හා මහන්සි වී වැඩකිරීම සම්බන්ධයෙන් ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. සමස්ත උත්සාහය බෙහෙවින් අගය කරන අතර සියලුම ඇල්මැති පාර්ශවකරුවන්ට වාසි සැලසෙන අයුරින් එක් එක් අවස්ථාවන් ප්‍රශස්ත කිරීමට අපි දිගින් දිගටම කටයුතු කරමු.

**ගාමිණී රාසපුත්‍ර**
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

# ආයතනික පාලන වාර්තාව

## ආයතනික පාලන වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගවීම, විනිවිදභාවය, සාධාරණත්වය සහ වගකීම හා ආයතනික කටයුතු මෙහෙයවීමේ, පාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ක්‍රමය සහතික කරනු වස්, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් ආයතනික පාලන රාමුවක් ක්‍රියාත්මක කරනු ලැබේ. සුදුසු ආයතනික ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික පාලනයේ වඩාත් උචිත ක්‍රියාමාර්ගයන් මඟින් ප්‍රගතිය කරා මඟපෙන්වීම සහ මෙහෙයවීම සිදුකරනු ලැබේ. මෙම ආයතනික පාලන ක්‍රියාමාර්ගයන් මඟින් තීරණ ගැනීමේ තත්ත්වය වැඩිදියුණු කරන අතර, සමාගමේ වර්ධනය, ලාභදායීත්වය සහ තිරසාරභාවය සහතික කරනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

සභාපතිතුමා විසින් මෙහෙයවනු ලබන සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පාලන ව්‍යුහය, ප්‍රතිපත්ති සහ ප්‍රගතීන් ගතික පරිසරයක ප්‍රමාණවත් ලෙස ශක්තිමත් සහ අදාල වන බවට සහතික වීමට බැඳී සිටී. ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය විසින් පත්කරන ලද සභාපති සහ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි යන විධායක අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු පස්දෙනෙකුගෙන් වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර ලේකම්වරයා වෙත සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත වාර්තා කරනු ඇත.

සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සියලුම සේවකයින් සමාගමේ කීර්තිනාමය කෙරෙහි බලපෑ හැකි යුතුකම් සහ වගකීම් ඉටුකිරීමේදී මෙම රාමුව අනුගමනය කළ යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ භාරකාරත්ව බැඳීම් ඉටුකිරීමේදී සමාගමේ සහ එහි පාර්ශ්වකරුවන්ගේ යහපත උදෙසා ක්‍රියාකළ යුතුය. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්මේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙම ආයතනික පාලන රාමුව අනුගමනය කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන අවශ්‍යතාවයන්, ස්වේච්ඡා කේත, ඉතා හොඳ වෙළෙඳපොල පරිචයන් සහ විනිවිදභාවයකින් යුතුව පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් ලබාදීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනු ලැබේ. නිරන්තරයෙන් බහු ශික්ෂණ නිපුණතාවන් පෙන්වමින් තෝරාගත් ක්ෂේත්‍රවල ඉහළම ස්ථානයට පැමිණ ඇති සහ විවිධ අංශවල විශේෂඥයින්ගෙන් සමන්විත ස්වාධීන කමිටුවක නිර්දේශ මත පදනම්ව ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය විසින් පත්කරන ලද ඉතා ගෞරවනීය පුද්ගලයින්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම වෙනුවෙන් උපාය මාර්ගික සැලැස්මක් සහ ප්‍රධාන ප්‍රතිපත්ති අනුමත කරනු ලබන අතර, ඒවා ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහ ප්‍රධාන කළමනාකරණ සේවක මණ්ඩලය මඟින් ඵලදායී ලෙස අධීක්ෂණය කරනු ලැබේ.

## විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන කටයුතු

ආයතනික ඉලක්ක සහ අරමුණු ළඟාකර ගැනීමෙහිලා සමාගමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී වෘත්තීය නිසි සැලකිල්ල, ආචාර ධර්ම, විනිවිදභාවය සහ ඒකීයභාවය පිළිබඳ වඩාත් යහපත් වත්පිළිවෙත් සහතික කරනු වස් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් නිරන්තරව අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කරනු ලැබේ. එබැවින්, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් ආයතනික යහපාලනයේ වටිනාකම හඳුනාගන්නා අතර, ශක්‍ය තිරසාර ව්‍යාපාරයක් සහතික කරමින් අවදානම් කළමනාකරණය කිරීමට සහ එහි පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් එකතු කිරීමට එමඟින් අවස්ථා සලසා දෙන බව විශ්වාස කෙරේ. තවද, විවිධ ක්ෂේත්‍රවල වෘත්තීය නිපුණතාවන් ඇති විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත ඉතා දක්ෂ විගණන කමිටුවක පැවැත්ම මඟින් ආයතනික පාලනයේ ඉතා හොඳ පරිචයන් සඳහා අපගේ කැපවීම වන බව සඳහන් කිරීමට කැමැත්තෙමු.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාගමේ ආයතනික කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කරනු වස්, සාකච්ඡා කර උපායමාර්ගික තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වේ. තවද, අධ්‍යක්ෂ මණ්ලඩය විසින්

උපාය මාර්ග, ව්‍යාපාරික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ එවැනි උපාය මාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ වර්ධනය සහතික කිරීම වැනි අනෙකුත් වැදගත් කරුණුවලට අමතරව, කළමනාකරණ ගිණුම් සහ ප්‍රගති වාර්තා සමාලෝචනය කරනු ලැබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩය විසින් සංයුක්ත සැලසුම්, වාර්ෂික අයවැය, ප්‍රාග්ධන වියදම්, නව ආයෝජන සහ ආයෝජන පිළිබඳ යෝජනා සමාලෝචනය කිරීමෙන් අනතුරුව, නව ව්‍යාපාර සඳහා අනුමැතිය ලබා දෙනු ලැබ'ෙග

## සමාගම් ලේකම්වරු සහ ස්වාධීන වෘත්තීය උපදෙස්

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වූ විට සමාගම් ලේකම්-වරුන්ගෙන් සහ විවිධ බාහිර වෘත්තීය ආයතනවලින් ස්වාධීන වෘත්තීය උපදෙස් ඉල්ලා සිටිනු ලැබේ. තවද, සමාගමේ සංයුක්ත ක්‍රමෝපායට අනුව, සමගාමී තාක්ෂණික අවශ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා සමාගම විසින් කෘෂිකර්ම, තාක්ෂණික සහ මූල්‍ය විශේෂඥයින් සමඟ සමීපව කටයුතු කරනු ලැබේ.

## ව්‍යාපාරික ඥාණය සහ කළමනාකරණ රැස්වීම්

ඒකකයේ එදිනෙදා කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සමාගම උපාය මාර්ගික ව්‍යාපාර ඒකකයේ මට්ටමින් සතිපතා මෙහෙයුම් රැස්වීම් පවත්වයි. තවද, සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් සමාගමේ කටයුතු සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අමතරව, මාසිකව කළමනාකරණ රැස්වීම් පවත්වනු ලැබේ. මෙම කළමනාකරණ රැස්වීම් මාසයේ තුන්වන සතියේ සෑම බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනකම පිළිවෙලින් පැල්වත්ත සහ සෙවනගල ඒකකවලදී පවත්වනු ලබන අතර, සභාපති සහ/හෝ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි විසින් එහි මුලසුන හොබවනු ලැබේ. සියලුම ප්‍රාදේශීය ප්‍රධානීන් සහ අංශ ප්‍රධානීන් මෙම රැස්වීම්වලට සහභාගී වන අතර, එහිදී පසුගිය මාසයේ ඔවුන්ගේ කාර්යසාධනය ඉදිරිපත් කිරීමටත්, ඔවුන් මුහුණ දෙන අභියෝග පිළිබඳව සහ මාසය තුළ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා එම අභියෝග ජයගැනීමට උපාය මාර්ග සාකච්ඡා කිරීමටත් අපේක්ෂා කෙරිණි.

## මූල්‍ය වාර්තාකරණය

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජය සතු ව්‍යාපාර සඳහා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් ලෙස එහි වාර්ෂික වාර්තා කාලානුරූපව පළකිරීම සඳහා සළකා බලනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් අවශ්‍ය මෙහෙයුම් තොරතුරු මෙම වාර්ෂික වාර්තාවල අඩංගු කෙරේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවය.

# ආයතනික සමාජීය වගකීම් වාර්තාව

ලංකා සීනි සමාගම ආයතනික සමාජීය වගකීම් රාශියක් ඉටු කරනු ලබයි. සමාගම එම ප්‍රදේශයේ ළදරු පාසල් 11 පවත්වාගෙන යනු ලබයි. මාර්ග 10ක් ආවරණය වන පරිදි සේවකයින්ගේ දරුවන් වෙනුවෙන් පාසල් බස් රථ සේවයක් පවත්වාගෙන යනු ලබයි. සමාගම විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි පාසැල්, පන්සල් සහ පොලිස් ස්ථාන වෙත නිරන්තරයෙන් උපකාරක සේවා සපයනු ලබයි. ලංකා සීනි සමාගම විසින් එහි සේවකයින් සහ ගොවින් සඳහාම වෙන්වූ වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබයි. විශාල පිරිවැයක් දරමින් සමාගම විසින් පිටත වගා ප්‍රදේශවල, ජානපදික ප්‍රදේශවල සහ අනෙකුත් වගා ප්‍රදේශවල මාර්ග නඩත්තු කටයුතු ඉටුකරනු ලබයි. එමෙන්ම අනියම් කම්කරුවන්ගේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් ලොරි රථ 48 ක් සමාගම විසින් වෙන් කර ඇත. ලංකා සීනි සමාගම අලින්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා රුපියල් මිලියන 400 පමණ වාර්ෂික වියදමක් දරමින් විශාල වපසරියක් ආවරණය වන පරිදි විදුලි වැටක් නඩත්තු කිරීම සහ සහ අනෙකුත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. මෙමගින් අවට ගම්වල ජනතාවගේද ජීවිත සහ දේපලවල සුරක්ෂිතබව තහවුරු වේ.

මොනරාගල දිස්ත්‍රික්කයේ විශාලතම ආයතනය වන . ලංකා සීනි සමාගම දිස්ත්‍රික්කයේ ජනතාවට ඍජු සහ වක්‍ර රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් සපයා ඇත. ඊට අමතරව සමාගම ගොවින් 10,000 කගේ ජීවනෝපාය පවත්වාගැනීමට සහාය වී ඇත. මේ තුලින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය ඉහල නංවාලීම සඳහා ලංකා සීනි සමාගම විශාල මෙහෙවරක් සිදු කරමින් ඇත.

සමාගමේ ප්‍රධාන අරමුණ සාධාරණ ලාභයක් උපාය ගැනීම වුවත්, නිෂ්පාදන ක්‍රියාවලියෙන් බැහැර වන අවශේෂ ද්‍රව්‍ය සහ විමෝචනයන්ගෙන් සිදු විය හැකි හානිකර බලපෑම් වලින් පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ගතහැකි සියලු ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන ඇත.

# අවදානම් කළමනාකරණය

| අවදානම් වර්ගීකරණය | විස්තරය | ක්‍රියාන්විතයේ සැලසුම |
|---|---|---|
| මෙහෙයුම් අවදානම | උක් වගාව සඳහා ඉඩම් වෙන්කිරීම. | ◆ උක්දඩු මිල රු. 8,000 සිට රු.10,000 දක්වා වැඩිකිරීම.<br>◆ අස්වැන්න සඳහා අත්තිකාරම් සහ ණය පදනම යටතේ අනෙකුත් ද්‍රව්‍ය පිරිනැමීම. |
| ණය අවදානම | ගොවීන්ට දෙන ලද යෙදවුම් හේතුකොට ගෙන බොල් ණය පැන නැගීම. | ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට වැඩි වගකීම් පැවරීම. |
| උද්ධමන අවදානම | වැඩි වූ යෙදවුම් පිරිවැය හා පොදුකාර්ය පිරිවැය හේතුකොට ගෙන ලාභදායීත්වයට බලපෑමේ අවකාශය | ඵලදායීතාව වැඩිකිරීම හා නිෂ්පාදන පිරිවැය අඩුකිරීම ඉලක්ක කිරීම. |
| වෙළඳපොල අවදානම | දේශීය සීනි සපයන්නන් අඩු මිලට සීනි ආනයනය කිරීම. | ඒකකයක පොදුකාර්ය පිරිවැය අඩුකිරීම පිණිස නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම. |
| පාරිසරික අවදානම | උක් අස්වැන්නට අලි ඇතුන්ගෙන් හා දේශගුණික වෙනස්වීම්වල බලපෑම, ඵලදාව අඩුවීමට හේතුවිය හැක. | සමාගමේ පිරිවැයෙන් අලි ඇතුන්ට එරෙහිව අගල් කැපීම, අලිවැට ඉදිකිරීම හා මිනිස් බාධක සංවර්ධනය කිරීම. |



# අපගේ සංස්කෘතිය සහ සාරධර්ම

**අපගේ ගොවියන්**

අපේ රජු ගොවියාය. ගොවියා සමාගමේ ඉතාමත් ප්‍රබල වැදගත් ඇල්මැති පාර්ශවකරුවන්ගෙන් කෙනෙකු බව සමාගම විශ්වාස කරයි. සෑම ඉඩමක්ම පාහේ වගා කරන්නේ ගොවීන් නිසා සෙවනගලට අයත් වගා ඉඩම් සීමිත ප්‍රමාණයක් පමණක් තිබීම, සෙවනගලට තීරණාත්මක සාධකයක් වෙයි. හෙක්ටෙයාරයක උක් වගාවකින් මාසයකට ලබාගත හැකි සාමාන්‍ය ආදායම රු45,000 ක් පමණ වන බව ඇස්තමේන්තු කර ඇත. බොහෝ ප්‍රදේශවල උක් වගාවේ නිරත ගොවීන්ගේ ආදායම පහළ මට්ටමක පැවතුණි. එම තත්වය ගොවීන් එම කර්මාන්තයේ රඳවා තබා ගැනීම අධෛර්යමත් කිරීමට හේතු විය. ඒ වෙනුවට ඔවුන් වෙනත් වගාවන්ට මාරු විය. ලංකා සීනි සමාගම මෙම තත්වය ආරම්භයේදීම හඳුනාගත් අතර ඔවුන්ගේ ආදායම වැඩිකිරීමට බොහෝ උත්සාහයන් ගනු ලැබීය. වර්තමානයේදී ගොවියෙකුට උක් මෙට්‍රික් ටොන් එකකට රු.10,000 ක් ගෙවනු ලබන අතර මීට පෙර එම මුදල මෙට්‍රික් ටොන් එකකට රු.8,000 කි. එබැවින්, මේ වනවිට උක් වගා ඉතිහාසයේ උක් මෙට්‍රික් ටොන් එකකට වැඩිම මිලක් ගෙවන ආයතනය බවට ලංකා සීනි සමාගම පත්වී ඇත.

**අපගේ ගනුදෙනුකරුවා**

අපේ ගනුදෙනුකරුවා අපේ බලාපොරොත්තුවයි. අප ජනගහනයෙන් මිලියන 20 කට අධික සංඛ්‍යාවක් අපගේ ගනුදෙනුකරුවන් වේ. අපගේ මූලික අරමුණ වනුයේ මොවුනට ගුණාත්මක සීනි සාධාරණ මිලකට සැපයීමයි. ශ්‍රී ලාංකිකයකුගේ සාමාන්‍ය වාර්ෂික සීනි පාරිභෝජනය කිලෝග්‍රෑම් 30 - 35 අතර වේ. අපගේ නිෂ්පාදන ධාරිතාව 10% ක වැනි පහත් මට්ටමක පවතින බැවින් ඉතිරි 90% ක ප්‍රමාණය ආනයනය කිරීමට සිදු වේ. වර්ෂයකට එ.ජ.ඩො 423 කට අධික වියදමක් සීනි ආනයනය කිරීම සඳහා දරනු ලැබේ. මෙය අපගේ ආර්ථිකයට බරපතල සෘණාත්මක බලපෑමකි.

**අපගේ සේවකයා**

අපගේ සේවකයා අපේ ධනය වෙයි. පක්ෂපාතී, අභිප්‍රේරිත සේවක පිරිසකගෙන් තොරව කිසිදු සංවිධානයකට සාර්ථක වීමේ හැකියාවක් නැත. අප සේවකයින්ගේ කැපවීමේ හා උත්සාහයේ මට්ටම පිළිඹිබු වන්නේ මෙහෙයුම් ප්‍රතිඵලවලිනි. ලංකා සීනි සමාගමේ වැදගත් කේන්ද්‍රස්ථානයක් වනුයේ එහි මානව සම්පතයි. අතීතයේදී සීනි කර්මාන්තයේ යෙදී සිටි සේවකයින්ට ඔවුන්ගේ ජීවන රටාව තුළ රැකියා කොන්දේසි, පහත් මට්ටමේ මාසික ආදායම, ප්‍රසාද දීමනා, උසස්වීම් ආදී ගැටලු සහිත අසීරු තත්වයන්ට මුහුණ දීමට සිදුවිය. මේ සම්බන්ධව දැනුවත් වී සමාගම මෙම ගැටලු වලට ඇමතීමට ප්‍රමුඛත්වය දී කටයුතු කළේය.

**යහපාලනය**

අපගේ ව්‍යවස්ථාපිත විගණක, විගණකාධිපති දෙපාර්තමේන්තුවයි. බාහිර විගණනයට අමතරව, පැල්වත්ත සහ සෙවනගල යන අංශ දෙකේම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු පිහිටුවා ඇති අතර එය සෘජුවම සභාපතිතුමාට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව, අඛණ්ඩ පදනමක් මත අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනයට ලක්කර ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ පැහැදිලි කිරීම් ලබාගෙන, ඔවුන්ගේ සොයාගැනීම් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

**සීමාවන්** (Constraints)

නිරන්තරයෙන් අනාගතය කරා දිශානත වීම සඳහා ප්‍රධාන ගැටලු කීපයක් තවමත් විසඳිය යුතුව ඇත. සමාගමට අයත් නොවන චංචල වත්කම් හේතුකොට ගෙන පැල්වත්ත හා සෙවනගල යන පරිශ්‍ර දෙකම අවහිර වී ඇත. ඒවා ඉවත් කිරීමට හෝ ක්‍රියාවලියට අන්තර්ග්‍රහණය කිරීමට නෛතික කටයුතු අවසන් වනතුරු බලාසිටිමු. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ඉතා සෙමින් සිදුවන අතර ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණයක් පවරාගන්නා තුරු අපගේ දිගුකාලීන හා මධ්‍යකාලීන සැලසුම් අත්හිටුවීමට සිදු වී ඇත. මෙය කළමනාකාරීත්වයේ පාලනයෙන් බැහැර කර්තව්‍යයකි.

ශ්‍රී ලංකා රජය විසින් නියම කර ඇති ඉලක්ක සපුරාලීම සඳහා අවශ්‍ය උපායමාර්ග දැනටමත් කළමනාකාරණය විසින් සම්පාදනය කොට ඇත. නව ආයෝජනයට අරමුදල් සපයා ගැනීම සමාගමට තවත් ගැටලුවක් වී ඇත. බොහෝ බැංකු සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ඇප වශයෙන් තබාගන්නා නමුත් පැල්වත්ත හා සෙවනගල ඉඩම්වල අයිතිය ලංකා සීනි (පුද්) සමාගමට නැත. කෙසේ වෙතත්, ආයතනය තුලින්ම අරමුදල් සම්පාදනය කරගැනීමේ කාර්යයයේ අප නිරතව සිටී.

පැල්වත්ත තොරතුරු පද්ධතිය තුල මෙහෙයුම් කටයුතුවල ඓතිහාසික හා වර්තමාන තොරතුරු තැන්පත්ව ඇත. එහෙත් සෙවනගල සේවක තොරතුරු සියල්ලක්ම පෙර කළමනාකාරීත්වය විසින් රැගෙන ගොස් ඇති හෙයින් සේවක පාරිතෝෂික දීමනා, ප්‍රතිපාදන සහ අනෙකුත් සේවකයන් සම්බන්ධ කරුණු අත්හිටුවා ඇත. එබැවින්, සෙවනගල සීනි සමාගමේ පෙර කළමනාකරණය විසින් පවත්වාගෙන ගිය පොත්පත් හා ලිපිලේඛන ලබාගැනීමට රජය විසින් පියවර ගත යුතුව ඇත.

# විගණන කමිටුවේ වාර්තාව

සමාගමේ විගණන කමිටුවේ සාමාජිකයින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබේ. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටු රැස්වීම්, අවශ්‍යතාවය පරිදි මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ සහභාගීත්වයෙන් රැස්කෙරේ. සභාපති, අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආරාධනයෙන් එම රැස්වීම්වලට සහභාගී වන අතර රැස්වීම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) විසිනි.

## විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම්

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ඇතුළුව සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හා මූල්‍ය වාර්තාකිරීමේ ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් පාලන වගකීම ඉටුකිරීමයි.

තවද, කලින් කල මහා භාණ්ඩාගරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ඇතුළුව සමාගමේ අභ්‍යන්තර පාලනය සහ අවදානම්වල කළමනාකරණය ප්‍රමාණවත්ද සහ සමාගම විසින් නෛතික හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කරගැනීම සඳහා ක්‍රියාවලීන් පිළිබඳ වගකීම් ඉටුකිරීමද ඇතුළත් වේ.

## මූල්‍ය වර්ෂය තුළ ලත් ප්‍රගතිය

විගණන කමිටු රැස්වීම් වාර්තා සටහන්, අනුමැතිය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ. විගණන කමිටුව, විගණන විෂය පථය, අරමුණුසහගත බව එහි ඵලදායීත්වය සමාලෝචනය සහ නිගමනය කරයි. කමිටුව, ලංකා සීනි සමාගමේ අනාගත අපේක්ෂාවන් සමඟ එහි මෙහෙයුම් සමාලෝචනයට ලක් කරයි. කමිටුව විසින් මතුකරන ලද ගැටලු වලට ප්‍රතිචාර වශයෙන් කළමනාකාරීත්වය ක්‍රියාමාර්ග ගන්නා අතර පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සඵලත්වය ගැන ව්‍යාපාර ඒකක ප්‍රධානීන්/ අධිකාරීවරුන් සමඟ සාකච්ඡා කර නිවැරදි ක්‍රියාමාර්ග නිර්දේශ කරනු ලැබේ

ලංකා සීනි (පුද්) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව, කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමඟ කළමනාකාරීත්වය සහ විගණකයින් සමඟ සාකච්ඡා කළ අතර, විගණකවරුන් විසින් ඉස්මතු කොට පෙන්වූ අසතුටුදායක ක්ෂේත්‍ර නිවැරදි කිරීමට පියවර ගන්නා ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් හඳුනාගන්නා ලද ව්‍යාපාර ඒකක දෙකෙහි අභ්‍යන්තර පාලන දුබලතා, අත්වැරදි, ප්‍රධාන විධායක නිලධාරී සමඟ සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සමඟ සාකච්ඡා කොට වැදගත් ක්ෂේත්‍ර සුදුසු නිර්දේශ සමඟ ඉස්මතු කොට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද සේවය සහ සමාගමේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ළඟා කරගැනීම සඳහා ඔවුන් දරන උත්සහාය සම්බන්ධයෙන් විගණන කමිටුවේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමු. විගණන කමිටු සාමාජිකයින් දෙන ලද දායකත්වය සම්බන්ධයෙන් කෘතඥතා පූර්වක ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි. ඔවුන්ගේ මූල්‍ය කරුණු පිළිබඳව ඇති ප්‍රවීනත්වය සහ අදාළ පළපුරුද්ද සමාගමේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා මිලකළ නොහැකිය.

**අජන්ත ගල්හේන**
සභාපති - විගණන කමිටුව

# මිහිරි සඵලත්වය

## කරා පැහැදිලි මගක්



# අධ්‍යක්ෂ මණ්ඩලය



**සභාපති**
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එස්.එම්.එස්.පී.බී සමරකෝන් RWP, RSP



**අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී**
ගාමිණී සෝමචන්ද්‍ර රාසපුත්‍ර මහතා



**අධ්‍යක්ෂ**
අජන්ත ගල්හේන



**අධ්‍යක්ෂ**
අමිතා දොඩන්වල



**අධ්‍යක්ෂ**
නීතිඥ සුමිත් පතිරණ මහතා



**අධ්‍යක්ෂ**
ලොහිත වේරගම මහතා



**අධ්‍යක්ෂ**
ලකිත් පංකජ ඩි සොයිසා මහතා

# අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

**සභාපති**

**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එස්.එම්.එස්.පී.බී සමරකෝන් RWP, RSP**

**වෘත්තිය පළපුරුද්ද**
ඔහු ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 37ක් සේවය කර ඇති අතර 11 වන පාබල සේනාංකයේ අණදෙන නිලධාරී ජෙනරාල් වශයෙන් අවසන් වරට සේවය කර ඇත.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**

**ගාමිණී සෝමචන්ද්‍ර මහතා**
ගාමිණී සෝමචන්ද්‍ර මහතා ලංකා සීනි (පුද්) සමාගමේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කරයි. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් කලා උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන ආයතනයෙන් පශ්චාත් උපාධි සුදුසුකම් හිමි කරගෙන ඇත.

**වෘත්තිය පළපුරුද්ද**
ප්‍රධාන විධායක නිලධාරී - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (2010-2015)

**අධ්‍යක්ෂ මණ්ඩලය**

**අජන්ත ගල්හේන මහතා**
අජන්ත ගල්හේන මහතා මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වන අතර ඔහු ලංකා සීනි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත ලෙස කටයුතු කරයි.

**වෘත්තිය පළපුරුද්ද**
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ සාමාජික.

**අමිතා දොඩන්වල මහත්මිය**
අමිතා දොඩන්වල මහත්මිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියකි. ඇය කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාදිය ලබාගෙන ඇත. තවද ඇය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

**වෘත්තිය පළපුරුද්ද**
2001 සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ සාමාජික.

**නීතිඥ සුමිත් පතිරණ මහතා**
සුමිත් පතිරණ මහතා වෘත්තියෙන් නීතිඥවරයෙකු වන අතර ලංකා සීනි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

**ලොහිත වේරගම මහතා**
ලොහිත වේරගම මහතා ලංකා සීනි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

**ලකිත් පංකජ ඩි සොයිසා මහතා**
ලකිත් පංකජ ඩි සොයිසා මහතා ලංකා සීනි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

# මිහිරි සවුලත්වයේ

## රස බෙදහැරීමේ කාලය



# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ ප්‍රධාන කාර්යාල සංවිධානයේ ව්‍යුහය



**සභාපති**
**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එස්.එම්.එස්.පී.බී සමරකෝන් RWP, RSP**



**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**
**ගාමිණී සෝමචන්ද්‍ර රාසපුත්‍ර මහතා**



**ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - පැල්වත්ත**
**මේජර් සමන් කුමාර මහතා**



**ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - සෙවනගල**
**කැළුම් ප්‍රියංකර**



**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)**
**ඩබ්ලිව්. ඒ. එන්. ආසිරි ප්‍රනාන්දු මහතා**

# සංවිධාන ව්‍යුහය - පැල්වත්ත



## ලංකා සීනි පුද්ගලික සමාගම
## විධායක කාර්ය මණ්ඩලය – පැල්වත්ත



ඩී.එම්.ඒ. දිසානායක- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය), ඩී.එම්.එස්. බණ්ඩාර- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කෘෂිකර්ම), සමන් කුමාර - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, එස්.එම්.එස්.පී.බී සමරකෝන් RWP, RSP- සභාපති, ගාමිණී රාසපුත්‍ර - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, රවීන්ද්‍ර හෙට්ටිආරච්චි- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ස්කාගාර), එල්. ගලගමආරච්චි (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්), ආර්.එම්.ඩබ්. හේමකුමාර- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා)

# සංවිධාන ව්‍යුහය - සෙවනගල



## ලංකා සීනි පුද්ගලික සමාගම
## විධායක කාර්ය මණ්ඩලය – සෙවනගල



**පළමු පෙළ -** ඩබ්.ඒ.එම්. චාන්දනී (ඉඩම් කළමණාකරු), ආර් එම් ඥානවතී (කාර්යාල විධායක), පී.එස්. ගයනි පීරිස් (ගණකාධිකාරී), ඩී.කේ.ඩබ්. ද සිල්වා ( උපදේශක කර්මාන්තශාලා ), එම්.ඩී.එන්. සේපාල ( උපදේශක විගණක ), කීර්ති පතිරණගේ (ප්‍රධාන මෙහෙයුම් නිළධාරී -ජෛව පොහොර ව්‍යාපෘතිය ), මේජර් ජනරාල් සාරද සමරකෝන් (සභාපති), ගාමිණී රාසපුත්‍ර (අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරී) , එච්.එම්.එස්. සමරවීර ( උපදේශක - කෘෂිකර්ම), අයි.ජේ. සතරසිංහ (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්), කේ.ඩී.එන්.පෙරේරා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුළ්‍ය), ජේ.පී.පී.කේ. ජයරත්න (රසායනාගාර ඉංජිනේරු),පී.ඒ.ලක්මා (ගණකාධිකාරී), එච්.එන්.ආර්. විජේතුංග (කළමණාකාර- මානව සම්පත් )

**දෙවන පෙළ -** ඩී.ඩී.සී. පණ්ඩිතගේ (ශෂ්‍ය විද්‍යාඥ) ඩී.එම්.පී.ජේ. රත්නායක (යාන්ත්‍රක අධිකාරී) , ටී.එල්. ගරුසිංහ ( ප්‍රවාහන කළමණාකරු ), පී. අනුර (රසායන ඉංජිනේරු), ඩබ්.එම්.පී.බී.කේ.ඩබ්. රණසිංහ (සහකාර කළමණාකාර -), පී.කේ. අනුර (ආරක්ෂක කළමණාකරු) කේ.ජේ.සී.ආර්. ජයසේකර (කළමණාකරු නීති සහ ඉඩම්), ඩී.සී. හෙට්ටිආරච්චි (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලා), ආර්.එම්.ඩී.එල්. හේමපාල (විමර්ශන නිළධාරී), එම්.යු. කුමාර (කළමණාකාර කෘෂි ව්‍යාප්ති), එන්.ඒ.එච්.කේ. අතුල සිරිවර්ධන (සාමාන්‍යාධිකාරී), එම්.ඩබ්.එස්.ආර්. ජයලත් (යාන්ත්‍රික ඉංජිනේරු-කර්මාන්ත ශාලා වැඩපල), එස්.වී.ඩී.එස්. ප්‍රියන්ත (සහකාර ඉංජිනේරු), කේ.පී.වී. මදුරංග ( කෘෂි ඉංජිනේරු වැඩපල ), එම්.කේ.එස්. ප්‍රියන්ත (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කෘෂි), ටී.ඩී.කේ.ජේ. සමන් කුමාර (කෘෂිකර්ම නිළධාරී)

**තෙවන පෙළ -** ඩබ්.සී. විජේනායක (කෘෂිකර්ම නිළධාරී) ,ඒ.ඩබ්.කේ.පී.සී.කේ. සෙනවිරත්න (කෘෂි ව්‍යාප්ති), එම්.ඩී.චන්ද්‍රපාල (යාන්ත්‍රික අධිකාරී), ඩබ්.යු.පී. කරුණාරත්න ( කෘෂි ඉංජිනේරු), ඊ.ඒ.පී.සී. එදිරිසිංහ (කෘෂි නිළධාරී), ඩබ්.පී.එස්.එන්. වර්ණකුල (කළමණාකරු නිෂ්පාදන), කේ. උපුල් (කෘෂි නිළධාරී), පී.ආර්. පී. කුමාර (කළමණාකරු කෘෂි )

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය - පැල්වත්ත



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා)
ආර්.එම්.ඩබ්. හේමකුමාර



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ස්කාගාර)
රවින්ද්‍ර හෙට්ටිආරච්චි



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කෘෂිකර්ම)
ඩී.එම්.එස්. බණ්ඩාර

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය - සෙවනගල



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා)
ඩී.සී. හෙට්ටිආරච්චි



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කෘෂිකර්ම)
සුගත් ප්‍රියන්ත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SPC/GHM/C/FA/1/SCPL/2023/04 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2025 මාර්තු 21 දින |

සභාපති,

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම,

**සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාචනය

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාචනය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පැල්වත්ත අංශයට අයත් රු.2,463,859,790 ක සීනි තොගය භෞතිකව සත්‍යාපනය කර නොතිබුණු බැවින් එම ශේෂයෙහි නිරවද්‍යතාවය විගණනයට තහවුරු නොකෙරුණි.

(ආ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය රජයට පවරා ගැනීමේදී එයින් ඉවත්ව වෙනම ආයතනයක් ලෙස කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආයතනයකට, අයත් හෙක්ටයාර් 20 ක් 2011 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා භාවිතා කිරීම වෙනුවෙන් එම ආයතනයට ගෙවිය යුතු රු.65,386,355 ක ශුද්ධ මුදල සහ එම ආයතනය විසින් සමාගමට අයත් නිල නිවාස භාවිතා කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.19,601,068 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නමුත්, එම ශේෂ තහවුරු කර ගැනීම සඳහා බඳු ගිවිසුම් හෝ ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පරිපාලන වියදම් රු.3,569,167,999 ක් සඳහා විස්තරාත්මක සටහනක් මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ඇතුලත් කර නොතිබුණි.

(ඈ) පැල්වත්ත අංශයේ ස්ථාපිත ස්කාගාර දෙපාර්තමේන්තුවට අයත් පිරිවැය රු.760,763,818 ක් වූ ස්ථාවර වත්කම් වලට අදාළව එක් එක් වත්කම් පන්තිවල එකතුව පමණක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණු බැවින් එම වටිනාකම් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ දී ක්ෂය ගණනය කිරීම හේතුවෙන් ක්ෂය වියදම් හා ක්ෂය වෙන් කිරීම්වල නිරවද්‍යතාවය විගණනයට තහවුරු නොකෙරුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 117 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. සෙවනගල අංශයට අදාළව ලංකා කාබොලික් ඉන්ඩස්ට්‍රි පුද්ගලික සමාගමෙන් 2016 වර්ෂයේ සිට අයවිය යුතු රු.7,473,696 ක් ද 2014 වර්ෂයේ සිට අයවිය යුතු කන්තලේ සීනි සමාගමේ රු.6,002,360 ක් හා SSP බදුල්ල ව්‍යාපෘතියෙන් අයවිය යුතු රු.6,665,725 ක මුදල ද අඩමාන ණය වශයෙන් වෙන්කර තිබුණු නමුත්, එම වෙන් කිරීම්වලට හේතු වූ කරුණු හා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) සෙවනගල හා පැල්වත්ත අංශවල වසර 08 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින පිළිවෙලින් රු.9,475,416 හා රු.4,904,160 ක් වූ මාර්ගස්ථ තොග සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවල විගණන වාර්තාව මහින්ද පෙන්වාදී තිබුණු නමුත් එම ශේෂයන් නිරවුල් කරගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානයටද කටයුතු කර නොතිබුණි.

(උ) පැල්වත්ත අංශය භුක්ති විඳින හෙක්ටයාර 1.212 කින් සමන්විත බඩල්කුඹුර උක් මිලදී ගැනීම් මධ්‍යස්ථානයේ ඉඩමෙහි සින්නක්කර අයිතිය සමාගමට නොතිබුණු නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) පැල්වත්ත ඒකකයෙන් 2022 ජූලි අවස්ථා 02 කදී සෙවනගල අංශය වෙත ප්‍රවාහනය කරන ලද රු.5,359,848 ක් වටිනා දැව්තෙල් ලීටර් 12792, සෙවනගල ඒකකය වෙත ලැබුණු බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(එ) පැල්වත්ත අංශයට අයත් කල්බදු වත්කම් ද සමඟ පිරිවැය රු.3,507,888,055 ක් වූ ක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ, වාරිමාර්ග හා විවිධ උපකරණ සහ කර්මාන්තශාලා බලාගාරය හා උපකරණවල ක්ෂය අනුපාතයන් පිළිවෙලින් සියයට 15 ක්, 6 ක් හා 5 ක් වන නමුත්, පිරිවැය රු.1,682,142,372 ක් වූ වත්කම් සියයට 2 ක සිට සියයට 50 ක අතර, විවිධ අනුපාතයන් යටතේ ක්ෂය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වියදම හා ක්ෂය වෙන්කිරීම්වල නිරවද්‍යතාවය පිළිගත නොහැකි විය.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව තවදුරටත් භාවිතයේ පවතින සෙවනගල අංශයට අයත් පිරිවැය රු.386,601,213 ක හා පැල්වත්ත අංශයට අයත් පිරිවැය රු.1,745,910,345 ක දේපළ පිරියත හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන්කර තිබුණද එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සෙවනගල අංශයේ භෞතික තොග සමීක්ෂණ වාර්තාව අනුව තොග ශේෂය රු.2,764,156,341 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එම වටිනාකම රු.3,675,660,095 ක් ලෙස අවසන් තොගය රු.911,503,754 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රමිතියක අවසරය හෝ අවශ්‍යතාවය මත හැර ආයතනයක ආදායම් සහ වියදම්, හිලව් නොකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළව පැල්වත්ත ඒකකය රු.3,406,051,222 ක ආදායම්, වියදම් සමඟ හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය අවසාන දිනට සෙවනගල අංශය විසින් ව්‍යාපාර සම්පත් සැලසුම් කරන පද්ධතිය (ERP System) සඳහා දරන ලද වියදම් රු.30,544,015 ක් වුවද, එය රු.35,650,647 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ග) ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සහ ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ සිට අවස්ථා 06 කදී රු.645,635,024 ක් රාජ්‍ය ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අදාළ වත්කම් ඉදිකිරීම/ මිලට ගැනීම අවසන් කර තිබුණි. කෙසේ නමුත් මෙම රාජ්‍ය ප්‍රදාන පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව ගැලපීම් සිදුකර නොතිබුණු බැවින් රාජ්‍ය ප්‍රදාන එම වටිනාකමින් වැඩියෙන්ද රඳවාගත් ඉපයුම එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂය අවසාන දිනට සෙවනගල අංශයේ ක්ෂේත්‍ර යන්ත්‍ර සහ උපකරණ වලට අදාළ ක්ෂය වෙන්කිරීම් වල වටිනාකම වූ රු.103,209,010 ක් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාරිමාර්ග සහ වෙනත් ක්ෂය වෙන්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් ක්ෂේත්‍ර යන්ත්‍ර සහ උපකරණ වල වටිනාකම රු.103,209,010 ක් වැඩියෙන්ද වාරිමාර්ග සහ වෙනත් වත්කම් වල වටිනාකම ඊට සමාන වටිනාකමකින් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ජ) 2012 වර්ෂයේදී සමාගම රජයට පවරා ගන්නා අවස්ථාවේදී ඵලදායිතා සංවර්ධන අමාත්‍යංශය, මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් රු.819,520,305 ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රාජ්‍ය ප්‍රදාන ලබාදී තිබුණි. මෙම රාජ්‍ය ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව ගිණුම්ගත කර නොතිබුණු බැවින් රඳවාගත් ඉපයුම් එම වටිනාකමින් අඩුවෙන්ද ප්‍රාග්ධන ප්‍රදාන එම වටිනාකමින් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ට) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 අනුව තොග නිකුත් කිරීම්, පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයට හෝ භරිත සාමාන්‍ය ක්‍රමයට මිල කළ යුතු වුවද, පැල්වත්ත අංශය විසින් දෝෂ පවතින මෘදුකාංග භාවිතා කර තොග අවසන් වරට මිලදීගෙන ඇති මිල මත පදනම්ව තොග නිකුත් කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී පිරිවැය හා නිකුතු මිල අතර ඇති වී තිබුණු රු.25,176,099 වෙනස තක්සේරු ගැලපීම් ගිණුමක් මගින් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කර තිබුණි.

(ඩ) 2022 වර්ෂයේ අප්‍රේල් සහ ජූලි මාසවල අවස්ථා 05 කදී සමාගමේ පැල්වත්ත ඒකකයෙන් සෙවනගල ඒකකය වෙත නිකුත් කර තිබුණු රු.7,487,688 ක් වටිනා දැව්තෙල් ලීටර් 32,136 ක් 2022 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ අන්තර සමාගම් ගිණුමට භර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙනත් ලැබිය යුතු දෑ සහ රඳවාගත් ඉපයුම රු.7,487,688 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂයේ භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව සෙවනගල අංශයේ ගබඩාවන්හි රු.6,777,664 ක් වටිනා තොග අයිතම 306 ක ඌනතාවයක් හා රු.5,192,624 ක් වටිනා තොග අයිතම 429 ක අතිරික්තයක් නිරීක්ෂණය වූ නමුත්, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි. භෞතිකව සත්‍යාපනය කරන ලද වටිනාකම ගණනය කළ නොහැකි තොග වර්ග 1195 ක් ද, ප්‍රයෝජනයට ගත නොහැකි හා අපහරණය කළ යුතු රු.4,044,995 ක් වටිනා තොග අයිතම 504 ක් ද ගබඩාවේ පැවතුණි. එම තොග සම්බන්ධයෙන්ද මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.

3

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍යදැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සමාගම තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම් කොටසේ (ඇ), (ඉ), (ඊ), (උ), (ඒ), (ඔ), (ණ) ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාඍකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානයන්ට යොමුව | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද නියෝගයන්හි 1 කොටසේ 30 වන නියෝගය | සීනි නිෂ්පාදනය හෝ සීනි පිරිපහදු කිරීම සම්බන්ධයෙන් කර්මාන්තශාලා සඳහා වාර්ෂික පාරිසරික බලපත්‍රය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 371 (02) සහ 2021 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිම මුදලක් දක්වා ගණන් දීමේ නිලධාරියගේ අනුමැතිය මත තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවද එයට අනුකූල නොවන ලෙස ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත ඉදිකිරීම් කටයුත්තක් සඳහා සිවිල් නඩත්තු කළමනාකරු වෙත රු. 5,310,000 ක අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. විගණිත දිනය වන විට අදාළ කාර්ය අවසන් කර මාස 05 ක් ගතවී තිබුණු නමුත් එම අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි. තවද මේ සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය මිලට ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියය අනුගමනය නොකර සමාගමේ සිවිල් නඩත්තු කළමනාකරුගේ අභිමතය පරිදි රු.5,130,000 ක මුදල වැයකර තිබුණි. ඒ අනුව, සමාගමට හිමිකමක් නොමැති ගොඩනැගිල්ලක් නවීකරණය සඳහා රු.5,310,000 ක රාජ්‍ය මුදල් වැයකර තිබුණු අතර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත මෙම කටයුතු සිදුකර තිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) XIX පරිච්ඡේදයේ 5.1 ඡේදය | පැල්වත්ත අංශයේ නිලධාරීන්ගේ නිවාස සඳහා නිවාස කුලී අයකර නොතිබුණු අතර, එම නිවාසවල අළුත්වැඩියා හා නඩත්තු වියදම් සමාගම විසින් දරා තිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 5.2 ඡේදය | මාසික නිවාස කුලිය සේවකයාගේ වැටුපෙන් ප්‍රතිශතක් ලෙස අයකල යුතු වුවද සමාගමේ සෙවනගල අංශය විසින් ඒ අනුව කටයුතු නොකර මාසිකව රු.100 ත් 850 ත් අතර විවිධ ගාස්තු ප්‍රමාණයෙන් නාමික කුලී ලෙස අයකර තිබුණි. |
| (iii)XIX පරිච්ඡේදයේ 5.8 ඡේදය | ජල බිල්පත් හා විදුලි බිල්පත් නිලධාරියා විසින් ගෙවිය යුතු වුවද සෙවනගල අංශයේ ජල පරිභෝජනය ඒකක 60 කට වැඩියෙන් භාවිතා කර ඇති අවස්ථාවලදී පමණක් නිලධාරියාගෙන් ගාස්තු අයකර ගැනීමත්, විදුලි පරිභෝජනය සඳහා මාසිකව රු.250 ක සහනයක් ලබාදීමෙන් පසු ඉතිරි විදුලි බිල වැටුපෙන් අයකර ගැනීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගමේ නිලධාරීන්ට අදාළ රු.11,394,170 ක පෞද්ගලික බිල්පත් පියවීමට සමාගමේ අරමුදල් භාවිතා කර තිබුණි. |
| (ඈ) 2023 දෙසැම්බර් 11 දිනැති අංක PED 04/2023 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 1.1 ඡේදය | යොමුගත ඡේදය ප්‍රකාරව සෙවනගල අංශයේ සහ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය හැකි ප්‍රසාද දීමනාව රු.27,225,000 ක් වුවද ප්‍රසාද දීමනා සහ දිරිදීමනා වශයෙන් රු.133,572,776 ක් ගෙවා තිබුණු බැවින් උක්ත විධිවිධාන වලට පටහැනිව රු.106,347,776 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ii) 1.2 ඡේදය | යොමුගත ඡේදය අනුව පැල්වත්ත අංශය සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය හැකි දිරිදීමනාව රු.80,600,000ක් වුවද දිරිදීමනා වශයෙන් රු.319,653,062ක් ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව උක්ත විධිවිධාන වලට පටහැනිව රු.239,053,062ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ඉ) 2023 මැයි 16 දිනැති අංක 01/2021(i)රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් සංශෝධිත 2021 නොවැම්බර් 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.9 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර විසින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාගම වෙත ලැබිය යුතු මුදල්/පාඩු කපා හැරීම් සිදු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කල යුතු වුවද, සමාගම එම විධිවිධාන |

| | | |
|---|---|---|
| | | අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී රු.473,274,504 ක කපාහැරීම සිදුකර තිබුණි. |
| (ඊ) | 2022 පෙබරවාරි 14 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස පැල්වත්ත හා සෙවනගල අංශවල නිලධාරීන 22 ක් සඳහා ඉන්ධන ලීටර 34,777 ක් වැඩිපුර ලබාදී ඒ සඳහා රු. 11,782,196 ක් ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඪ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඬ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සෙවනගල කර්මාන්තශාලාවේ ධාරිතාවය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2023 අප්‍රේල් 23 දින ආරම්භකර තිබුණු නමුත් මෙම ව්‍යාපෘතිය 2024 අගෝස්තු 07 දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නොතිබුණු අතර ඒ සඳහා ආනයනය කර තිබුණු රු.201,782,433 ක යන්ත්‍ර වල වගකීම් කාලය ඉකුත් වී තිබුණි. යන්ත්‍ර ආනයනය කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් රු.3,622,005 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර රු.7,723,058 ක යන්ත්‍රයක් ආනයනය කර තිබුණ අතර, යන්ත්‍ර සවිකිරීම සඳහා ඉන්දියාවේ සිට පැමිණි සැපයුම්කරුගේ සේවකයන් වෙත ආහාරපාන සහ ප්‍රවාහන පහසුකම් ලබදීම සඳහා රු.2,824,704 ක් වැයකර තිබුණි.

(ආ) සමාගමේ පැල්වත්ත හා සෙවනගල ඒකකයන්හි බොයිලේරු සඳහා දැවිතෙල් මිලදීගැනීමේදී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී නොගෙන, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් අනුගමනය නොකර බාහිර පුද්ගලයෙකු වෙත දැවිතෙල් මිලදීගැනීමේ ටෙන්ඩරය පිරිනමා තිබුණි. ඒ අනුව අදාළ සැපයුම්කරු විසින් පිරිපහදු කළ දැවිතෙල් වෙනුවට නැව් සහ යන්ත්‍ර වලින් ඉවත් කරන ලද පිරිපහදු නොකළ කළුතෙල් සපයා තිබුණු අතර සමාගම ඒ වෙනුවෙන් රු.341,687,582 ක් ගෙවා තිබුණි. එම කළුතෙල් භාවිතා කළ කාල සීමාවේ බොයිලේරුව නිරන්තරයෙන් අක්‍රිය වී තිබුණ බැවින් එම අක්‍රිය වී තිබූ දින 46 ක කාලය තුල රු. මිලියන 300 ක් වටිනා එතනෝල් ලීටර් 6000 ක නිෂ්පාදනයක් සමාගමට අහිමි වී තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සහ ඉන් පසු වර්ෂවලදී ආරම්භ කර තිබූ විවිධ ව්‍යාපෘති 11 ක් මුළුමනින්ම අත්හැර දමා තිබූ අතර එකී ව්‍යාපෘති 11 සඳහා 2022 මාර්තු මස අවසන් වනවිට රු.176,665,880 ක් වැය කර තිබුණි. එමෙන්ම අදාළ ව්‍යාපෘතිය ආරම්භ කර දැනට වසර 09 සිට 13 හෝ ඊට වැඩි කාලයක් ගතවී තිබුණද එම ව්‍යාපෘති නිමකිරීමට අපොහොසත්ව තිබුණි. ඒ අනුව වැයකර තිබූ රු. මිලියන 176 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබූ අතර සමාගම අපේක්ෂා කරන ලද අරමුණු ඉටුකර ගැනීමටද නොහැකි වී තිබුණි.

(ඈ) 2011 වර්ෂයේදී සී/ස ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකය රජයට පවරා ගැනීමෙන් පසු සමාගමේ එම ඒකකය සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය (Cadre) හඳුනාගෙන මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර සේවක සංඛ්‍යාව අනුමත කිරීමට සහ විධිමත් බඳවාගැනීමේ පරිපාටි සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී 2021/2022 වර්ෂ වලදී අවිධිමත් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සේවකයින් 159 ක් බඳවාගෙන තිබුණි. එසේම සේවකයින් 510 ක් වෙත සුදුසුකම හා පළපුරුද්ද විධිමත් පරිපාටියක් අනුගමනය කරමින්, පරීක්ෂා කිරීමකින් තොරව උසස්වීම් ප්‍රදානය කර තිබුණි.

7

(ඉ) සමාගමේ සෙවනගල අංශයේ ස්කාගාරය සඳහා අවශ්‍ය ස්ටීම් (Steam) ලබාගැනීම සඳහා බාහිර පුද්ගලයෙකුට අයත් බයෝමාස් බොයිලේරුවක් ආයතනය තුළ ස්ථාපනය කර වාර්ෂිකව අවශ්‍ය වන ස්ටීම් මෙට්‍රික් ටොන් 32400 ක් රු.317,520,000 කට ලබාගැනීමට ගිවිසුම්ගත වී තිබුණු නමුත් අදාළ සැපයුම්කරු තෝරාගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කර නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා කර්මාන්තශාලා උපදේශක විසින් ව්‍යාජ ලෙස සැකසූ දත්ත ඇතුළත් කර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන තිබුණි. තවද 2024 අගෝස්තු 07 දින වන විටත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින නමුත් සැපයුම්කරු වෙත රු.48,600,000 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි.

(ඊ) සමාගමේ කටයුතු සඳහා සම්බන්ධයක් නොමැති බාහිර පුද්ගලයන් සහ ආයතන වලට සමාගමේ ආගන්තුක නිවාස වල නවාතැන් සහ ආහාර පාන සැපයීම වෙනුවෙන් 2020 ජනවාරි සිට 2022 අප්‍රේල් මස දක්වා රු. 10,260,433 ක් වැයකර තිබුණි.

(උ) සෙවනගල ඒකකය සතු බැංකු ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.4,958,247 ක මුදලක් පැවති අතර 2013 ජුනි 04 දිනෙන් පසු එම ගිණුම මගින් ගණුදෙනු සිදුකර නොතිබුණි. එම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම අහිමි වී තිබුණි.

(ඌ) උක් වගාව සඳහා සමාගමෙන් රු.1,262,363,910 ක ණය ලබාගත් ගොවීන්ගෙන් උක් වගාවෙන් බැහැර වෙනත් වගාවන් සඳහා යොමු වී තිබුණු ගොවීන් 159 දෙනෙකු නැවත උක් වගාව සඳහා යොමුකරවීමට සහ එම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම ලැබිය යුතු ගොවිණය වලින් රු.61,527,826 ක් වසර 05 කට වඩා පැරණි ණය වන අතර රු.77,719,383 ක් වසර 03 ත් 05 ත් අතර කාලයකට අදාළ ණය ශේෂ වේ.

(එ) සෙවනගල අංශයේ භාවිතයෙන් ඉවත් කර තිබුණු වාහන 18 කට අදාළ රු.13,041,107 ක් වූ ද්‍රව්‍ය හා උපකරණ ඒකක 2284 ක් සහ ගබඩාව තුළ වසර 05 කට වැඩි කාලයක සිට භාවිතයට නොගන්නා වටිනාකම රු.85,305,687 ක් වන ද්‍රව්‍ය හා උපකරණ ඒකක 6269 ක් සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි.

(ඒ) සෙවනගල අංශයේ ප්‍රධාන ගබඩාවේ තිබුණු විවෘත වෙළඳපොල වටිනාකම රු.560,700 ක් වූ පිත්තල හා තඹ කිලෝග්‍රෑම් 1486 ක ඌනතාවයක් තිබුණි.

(ඔ) පැල්වත්ත අංශය විසින් සමාලෝචිත වර්ෂයේදී විකුණා තිබුණු නමුත් තොග සමීක්ෂණ අවස්ථාව වන විටත් ගැනුම්කරුවන් විසින් ඉවත් කරගෙන නොතිබුණු සීනි මෙට්‍රික් ටොන් 2626 ක් ගබඩාවේ පැවති අතර තෙවන පාර්ශවයකට අයත් මෙම තොගය සඳහා සමාගම විසින් දින 04 ක සිට දින 48 ක් දක්වා කාලයක් ගබඩා පහසුකම් සපයා තිබුණි. තවද විකුණුම් වටිනාකම රු.885,962,222 ක් වූ තෙවන පාර්ශවයකට අයත් තොග ගබඩාවේ රඳවා තබා ගැනීම මගින් සමාගම විසින් ගබඩා පිරිවැයක් දරා තිබීම, අවධානමක් දරා තිබීම සහ රු.7,589,750 ප්‍රමාද ගාස්තු ද අය කරගෙන නොතිබුණි.

(ඕ) පැල්වත්ත අංශය සතු පොහොර ගබඩාව තුළ සීනි සුදු වර්ණ කිරීමට යොදාගත් පිරිවැය රු.1,174,216 ක් වූ "සල්ෆර්" කිලෝග්‍රෑම් 19,695 ක් ගබඩාකර තිබුණු අතර මෙම සල්ෆර් තොගය කල්ඉකුත් වී භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.

(ක) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අපහරණය කිරීමට නිර්දේශ ලබාදී තිබුණු කල් ඉකුත් වූ පිරිවැය රු.6,051,597 ක් වූ ෂෙල්ග්‍රීස් කිලෝග්‍රෑම් 900 ක්, 2 T ඔයිල් ලීටර් 60 ක් සහ මෙරෝෆා ලීටර් 560 ක් ඉන්ධන ගබඩා පරිශ්‍රය තුළ පැවතුණි. ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ග) සමාගමේ පැල්වත්ත අංශයේ හෙක්ටයාර් 4,607 ක ඉඩම් 4 ක පිරිවැය වූ රු.44,149,728 ක් ගිණුම්වල දක්වා තිබුණු නමුත් එයින් පිරිවැය රු.28,050,728 ක පැල්වත්ත හා ප්‍රධාන කාර්යාලය පිහිටි හෙක්ටයාර් 1,686 ක ඉඩම් වල අයිතිය සමාගම සතුව නොපැවතුණි.

(ච) 2018 වර්ෂයේදී සෙවනගල අංශය විසින් රු.9,564,866 ක් වටිනා වාෂ්පීකරණ යන්ත්‍රයක් (Evaporator) ඉන්දියාවෙන් ආනයනය කර රු.3,924,394 ක රේගු ගාස්තු ගෙවා තිබුණි. ඊට අදාල උපාංග (SS Tube) පිරිවිතරවලට එකඟ නොවීම මත ආපසු යවා 2019 වර්ෂයේදී නැවත ආනයනය කිරීමේදී ගෙවා තිබුණු රු.4,830,446 ක රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් එම වටිනාකම සමාගමට පාඩුවක් වී තිබුණි.

(ජ) සෙවනගල ඒකකය සතු කලාප අංක 04 (කොවුල් ආර) සහ කලාප අංක 05 (ගිනිගල්පැලැස්ස) අයත් ඉඩම් හෙක්ටයාර් 1072.89 ප්‍රමාණයකින් හෙක්ටයාර් 74.21 ප්‍රමාණයක් අනවසර බෝග වගාවන් සහ හෙක්ටයාර් 8.32 ක ප්‍රමාණයක අනවසර ඉදිකිරීම් (නිවාස සහ වෙළඳසැල්) සිදුකර තිබුණි.

(ට) සෙවනගල ඒකකයේ 2023 වර්ෂයේ නිලධාරීන් සහ ගොවිමහතුන් සඳහා සිනි කිලෝග්‍රෑම් 276015 ක් රු. 65 ක මිලකට සහ කිලෝග්‍රෑම් 208195 ක් රු. 170 ක මිලකට ලබා දී තිබුණි. 2023 වර්ෂයේ සිනි කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු. 262.69 ක් වී තිබුණු අතර නිෂ්පාදන පිරිවැය ආවරණය නොවන මිලකට සිනි තොග ලබාදීමෙන් සමාගමට රු.73,863,484 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඩ) අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගෙන ගබඩා අයිතම මිලදීගෙන තිබුණු බැවින් සෙවනගල සහ පැල්වත්ත අංශවල පිළිවෙලින් රු.85,305,687 ක් වටිනා තොග අයිතම 6269 ක් සහ රු.48,348,295 ක් වටිනා තොග අයිතම 1662 ක් වසර 05 ක කාලයක සිට නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි.

(ණ) පැල්වත්ත අංශය 2013 වර්ෂයේදී කල් බදු පහසුකම් යටතේ රු.128,910,000 ක ක්‍රේන් යන්ත්‍රයක් මිලදීගැනීම සඳහා රු.120,750,000 ක මුදලක් හා ඊට අවශ්‍ය විදුලිය සැපයීමට රු.2,254,850 ක් වැය කර තිබුණි. එසේ වුවද, සැපයුම්කරු විසින් එකඟ වූ පරිදි එම යන්ත්‍රය කර්මාන්තායතනය තුළ ස්ථාපිත නොකිරීම හේතුවෙන් රු.123,004,850 ක පිරිවැයක් දරා තිබුණු මෙම යන්ත්‍රය මිලදීගත් දින සිට ප්‍රයෝජනයට ගත නොහැකිව නිශ්කාර්යව පැවතුණි.

(ත) ලංකා සිනි සමාගමේ ප්‍රධාන කාර්යාලය විසින් මොලැසස් මෙට්‍රික් ටොන් 5000 ක් ආනයනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු වශයෙන් ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත රු.4,445,682 ක් 2022 වර්ෂයේදී ගෙවා තිබුණු ද සමාගම මොලැසස් ආනයනය කර නොතිබුණු බැවින් ඒ සඳහා දරන ලද වියදම නිෂ්කාර්යය වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

| | සටහන් | 2023<br>රුපියල් | 2022<br>රුපියල් |
|---|---|---|---|
| ආදායම | 4 | 16,095,088,733 | 19,287,059,633 |
| විකුණුම් පිරිවැය | | (10,514,186,029) | (10,550,156,934) |
| **දළ ලාභය** | | 5,580,902,704 | 8,736,902,699 |
| වෙනත් ආදායම් සහ ලැබීම් | 5 | 233,273,792 | 207,049,922 |
| පරිපාලන වියදම් | | (3,566,423,815) | (3,352,575,449) |
| මූල්‍ය වියදම් | 6 | (69,120,741) | (87,338,394) |
| මූල්‍ය ආදායම් | 6 | 656,487,028 | 541,537,093 |
| **බද්දට පෙර ලාභය/ (පාඩුව)** | 7 | 2,835,118,969 | 6,045,575,871 |
| බදු වියදම | 8 | (502,837,242) | (1,131,502,649) |
| **වර්ෂය සඳහා ලාභය/ පාඩුව** | | 2,332,281,727 | 4,914,073,222 |
| **කාලපරිච්ඡේදය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම - බදු ශුද්ධ** | | (199,122,893) | (125,052,954) |
| **කාල පරිච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ ආදායම - බදු පසු ශුද්ධ** | | 2,133,158,834 | 4,789,020,268 |
| | | | |
| කොටසකට ඉපැයීම් (පාඩුව) | 9 | 23,322,817 | 49,140,732 |

40 වැනි පිටුවේ සිට 60 වැනි පිටුව දක්වා සඳහන් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ වල ඒකාබද්ධ කොටසක් සේ සැලකිය යුතුයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනට

| වත්කම් | සටහන් | 2023<br>රුපියල් | 2022<br>රුපියල් |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 10 | 3,640,993,724 | 2,435,563,340 |
| **ජංගම නොවන ආයෝජන** | 8 | - | 43,544,918 |
| | | **3,640,993,724** | **2,479,108,258** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 11 | 8,311,492,472 | 4,961,314,936 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 12 | 707,948,224 | 890,667,065 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 13 | 1,036,246,085 | 611,771,676 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | | 182,674,824 | 148,669,124 |
| ගොවීන්ගෙන් අයවිය යුතු ණය | 14 | 1,559,543,843 | 1,463,467,286 |
| සම්බන්ධිත පාර්ශවවලින් අයවිය යුතු මුදල් | 25.1 | - | - |
| ආයෝජන | 15 | 2,033,318,775 | 1,237,947,390 |
| මුදල් සහ මුදලට සමාන දෑ | 21 | 1,155,347,328 | 3,972,130,456 |
| | | 14,986,571,552 | 13,285,967,934 |
| **මුළු වත්කම්** | | **18,627,565,275** | **15,765,076,191** |
| **හිමිකම් ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 1,000 | 1,000 |
| රජයේ ප්‍රදාන | 17 | 4,674,488,363 | 4,674,488,363 |
| සමුච්ත ලාභය/ (පාඩුව) | | 6,635,015,716 | 6,573,568,061 |
| **මුළු හිමිකම** | | **11,309,505,079** | **11,248,057,424** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත බදු බැරකම් | 8 | 744,153,029 | 580,381,458 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 19 | 1,118,049,383 | 814,574,021 |
| පොලී දරන ණය හා ණයගැනීම් | 18 | 40,773,733 | 128,784,134 |
| | | 1,902,976,146 | 1,523,739,613 |
| **ජංගම වගකීම්** | | | |
| පොලී දරන ණය හා ණය ගැනීම් | 18 | 95,585,542 | 128,842,356 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | 20 | 3,659,478,097 | 2,292,075,108 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 1,168,506,338 | 1,207,048,360 |
| සම්බන්ධිත පාර්ශවවලට ගෙවිය යුතු මුදල් | | 142,084,771 | (634,686,671) |
| බැංකු අයිරාව | | 349,429,306 | - |
| | | 5,415,084,054 | 2,993,279,153 |
| **මුළු හිමිකම හා වගකීම්** | | **18,627,565,275** | **15,765,076,191** |

……………………………………..
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය**

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන තබන ලද්දේ :

……………………………………..
**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එස්.එම්.එස්.පී.බී සමරකෝන් RWP, RSP**
**සභාපති / අධ්‍යක්ෂ**
**ලංකා සීනී (පුද්) සමාගම**

……………………………………..
**ගාමිණී රාසපුත්‍ර**
**ප්‍රධාන විධායක නිළධාරී /අධ්‍යක්ෂ**
**ලංකා සීනී (පුද්) සමාගම**

2024 නොවැම්බර් 19
කොළඹ

40 වැනි පිටුවේ සිට 60 වැනි පිටුව දක්වා සඳහන් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ වල ඒකාබද්ධ කොටසක් සේ සැලකිය යුතුයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් | රජයේ ප්‍රධානය රුපියල් | සමුච්චිත ලාභයන් රුපියල් | මුළු ගණන රුපියල් |
|---|---|---|---|---|
| 2022 ජනවාරි 01 දිනට | 1,000 | 4,674,488,363 | 1,535,883,363 | 6,210,372,726 |
| රජයේ ප්‍රදාන ගෙවීම් | - | | - | - |
| ජාතිය ගොඩනැගීමේ බදු ගැලපුම් | - | - | 109,138,256 | 109,138,256 |
| ගොවි ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් ආපසු හැරවීම් | - | - | 139,526,174 | 139,526,174 |
| වර්ෂය සඳහා ලාභය/(පාඩුව) | - | - | 4,914,073,222 | 4,914,073,222 |
| | | | | - |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | - | - | (125,052,954) | (125,052,954) |
| මුළු විස්තීර්ණ ආදායම | - | - | 4,789,020,268 | 4,789,020,268 |
| 2022 දෙසැම්බර් 31 දිනට | 1,000 | 4,674,488,363 | 6,573,568,061 | 11,248,057,424 |
| රජයේ ප්‍රදාන ලැබීම් | - | - | | - |
| ලාභාංශ ගෙවීම් 2020 | - | | (351,570,485) | (351,570,485) |
| ලාභාංශ ගෙවීම් 2021 | | | (245,918,727) | (245,918,727) |
| ලාභාංශ ගෙවීම් 2022 | - | | (1,474,221,967) | (1,474,221,967) |
| වර්ෂය සඳහා ලාභය | - | | 2,332,281,727 | 2,332,281,727 |
| අනෙකුත් විස්තීරණ ආදායම | | | (199,122,893) | (199,122,893) |
| මුළු විස්තීරණ ආදායම | - | - | 2,133,158,834 | 2,133,158,834 |
| 2023 දෙසැම්බර් 31 දිනට | 1,000 | 4,674,488,363 | 6,635,015,716 | 11,309,505,079 |

40 වැනි පිටුවේ සිට 60 වැනි පිටුව දක්වා සඳහන් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ වල ඒකාබද්ධ කොටසක් සේ සැලකිය යුතුයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

| | සටහන් | 2023 රුපියල් | 2022 රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| බද්දට පෙර ලාභය/ (අලාභය) | | 2,835,118,969 | 6,045,575,871 |
| ගැලපුම්: | | | |
| ක්ෂය කිරීම් | 10 | 445,264,798 | 378,551,821 |
| මූල්‍ය ආදායම් | 6 | (656,487,028) | (541,537,093) |
| මූල්‍ය පිරිවැය | 6 | 69,120,741 | 87,338,394 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන | 19 | 206,549,761 | 122,333,520 |
| ගොවි ණය සඳහා ප්‍රතිපාදන | 11 | (458,330,841) | (3,618,596) |
| පෙර වර්ෂයේ ගැලපුම් | | - | 248,664,430 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/ (පාඩුව) | | 2,441,236,399 | 6,337,308,347 |
| තොග (වැඩිවීම)/ අඩුවීම | | (3,350,177,536) | (2,345,626,124) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්වල වැඩිවීම | | (458,480,109) | (337,845,786) |
| ගොවීන්ගෙන් ලැබිය යුතු ණය අඩුවීම | | 362,254,284 | (450,055,042) |
| සම්බන්ධිත පාර්ශව වලට ගෙවිය යුතු මුදල් වැඩිවීම | | 776,771,442 | (612,498,720) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම) | | 861,460,804 | (15,920,581) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් | | 633,065,284 | 2,575,362,094 |
| ගෙවූ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | (345,887,473) | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | 19 | (102,197,292) | (23,809,975) |
| | | 184,980,519 | 2,551,552,119 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතා වූ) මුදල් ප්‍රවාහය: | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | | (1,650,695,183) | (864,985,546) |
| ස්ථාවර තැන්පත්වල ආයෝජන ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම | | (751,826,467) | 1,253,981,953 |
| ජීව විද්‍යාත්මක වත්කම්වල ආයෝජන | | 182,718,841 | (101,178,776) |
| ලද මූල්‍ය ආදායම් | | 656,487,028 | 541,537,093 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 6 | (1,563,315,780) | 829,354,724 |
| මූල්‍ය ක්‍රියාකාකම්වලින්/ (භාවිතා කළ) වූ මුදල් ප්‍රවාහයන්, | | | |
| ලබාගත් ණය/ මූල්‍ය කල්බදු | | - | - |
| ණය පියවීම | 18 | - | (8,106,458) |
| රජයේ ප්‍රදානයන් | | - | |
| මූල්‍ය කල්බදු වගකීම්වල මුල් මුදල ආපසු ගෙවීම | 18 | (121,267,215) | (103,220,945) |
| ගෙවූ පොලී | 6 | (69,120,741) | (87,338,394) |
| ලාභාංශ ගෙවීම් | | (1,597,489,212) | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (1,787,877,168) | (198,665,797) |
| මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | (3,166,212,429) | 3,182,241,046 |
| වර්ෂය ආරම්භයේදී වූ මුදල් හා මුදල් හා සමාන දෑ | 21 | 3,972,130,454 | 789,889,406 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ | 21 | 805,918,022 | 3,972,130,454 |

40 වැනි පිටුවේ සිට 60 වැනි පිටුව දක්වා සඳහන් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ වල ඒකාබද්ධ කොටසක් සේ සැලකිය යුතුයි.

සීමාාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### 1. සංයුක්ත තොරතුරු

### 1.1 පොදු කරුණු

සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගම ශ්‍රී ලංකාවේ දී සංස්ථාපිත කොට ප්‍රතිෂ්ඨාපනය කර ඇති ආයතනයකි. රජයට පවරාගැනීමෙන් පසු සමාගම පුද්ගලික සීමාසහිත සමාගමක් ලෙස ස්ථාපිත කරන ලදී. සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගමේ ලියාපදිංචි ලිපිනය කොළඹ 04, මෙල්බන් ඇවනියු, අංක 27 දරණ ස්ථානය වන අතර එහි ප්‍රධාන ව්‍යාපාර පරිශ්‍රයන් ඇඹිලිපිටිය හා බුත්තල ස්ථානගත කර ඇත. සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමෙන් අනතුරුව, පැල්වත්ත සුගර් ඉන්ඩස්ට්‍රීස් සහ සෙවනගල සුගර් ඉන්ඩස්ට්‍රීස් දෙකෙහි වත්කම් හා වගකීම්, 2012 ඔක්තෝබර් 01 දින සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගම වෙත මාරු කරන ලදී.

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මූල්‍ය කාලපරිච්ඡේදය තුළදී, සමාගමේ මූලික ක්‍රියාකාරීත්වයන් වූයේ උක් වගාකිරීම සීනි හා එතනෝල් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අනුමැතිය දුන් දිනය

සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම 2024 නොවැම්බර් 19 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදෙන ලදී.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

**2. පොදු ප්‍රතිපත්ති**

**2.1 පිළියෙල කිරීමේ පදනම**

මූල්‍ය තත්ව ප්‍රකාශය, ලාභාලාභ ප්‍රකාශය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් යනාදියෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වේ. සමාගමේ මූල්‍ය ප්‍රකාශ, වෙනත් ආකාරයකින් දක්වා නැතහොත් ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කරන ලදී.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.

**2.1.1 අනුකූලතා ප්‍රකාශය**

සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සිදුකර ඇත.

**2.1.2 අඛණ්ඩ පැවැත්ම**

සමාගමට සැලකිය යුතු අනාගත කාලපරිච්ඡේදයක් සඳහා අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වාගෙන යාමට හැකියාව ඇති බවටත්, එය ඇවර කිරීමකට හෝ වෙළඳාම අත්හිටුවීමේ අපේක්ෂාවක් නැති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇත.

**2.2 සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

සමාගම එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

**2.2.1 කාර්යමය සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය**

සමාගම මූලික වශයෙන් වාණිජමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලින් කරන නිසා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව මෙහි සඳහන් සමාගමට අදාළ සිදුවීම් හා අවස්ථාවන්වල ආර්ථික තත්වය වඩාත් හොඳින් නිරූපනය වේ. විදේශීය මුදලින් වූ ගනුදෙනු එකී ගනුදෙනුව සිදුවූ දින පැවැති විදේශ විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලදී. වාර්තා කරන දිනට විදේශීය මුදලින් නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් එකී වත්කම් හා වගකීම් ජනිත දිනට වූ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. පරිවර්තනය හේතුවෙන් උද්ගත වන විදේශ විනිමය වෙනස ලාභාලාභ ප්‍රකාශයට එරෙහිව හඳුනාගනු ලැබේ.

සියලුම වෙනස්වීම් ලාභාලාභ ප්‍රකාශයට ගනු ලැබේ. විදේශ මුදලක් ලෙස ඓතිහාසික පිරිවැය අනුව ඇති මූල්‍යමය නොවන වත්කම් හා වගකීම්, එකී ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පැවැති විනිමය අනුපාතය අනුව පරිවර්තනය කෙරේ. විදේශීය මුදලකින් ඇති සාධාරණ අගයට මිනුම් කර ඇති මූල්‍යමය නොවන විෂයයන්, සාධාරණ අගය නිශ්චය කළ දිනට පැවැති විනිමය අනුපාතය භාවිතා කොට පරිවර්තනය කරනු ලැබේ. මූල්‍යමය නොවන විෂයයන් පරිවර්තනය කිරීම හේතුකොට ගෙන උද්ගත වන වාසි හෝ අවාසි, අදාළ විෂයයයේ සාධාරණ වටිනාකම වෙනස්වීමේදී වූ වාසි හෝ අවාසි හඳුනාගැනීමක් ලෙස සලකනු ලැබේ. (විෂයයන්වල පරිවර්තන වෙනස්කම් මත උද්ගත වූ සාධාරණ වටිනාකම් වාසි හෝ අවාසි, අනෙකුත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගැනීම හෝ ලාභ හෝ අලාභ ද අනෙකුත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගනු ලැබේ.)

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### 2.2.2 ආදයම හඳුනාගැනීම

ගෙවීම් කරනු ලබන්නේ කවදාද යන්න සැලකිල්ලට නොගෙන සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම සහ ආදායම විශ්වාසදායක ලෙස මිනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ගිවිසුම්ගතව විස්තර කර ඇති ගෙවීම් කොන්දේසි සැලකිල්ලට ගෙන බදු හා රේගු බදු හැර, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සමාගම ප්‍රධානියා හෝ නියෝජිතයා ලෙස ක්‍රියාකරන්නේ නම් එහි ආදායම සකස් කර ගැනීම් නිශ්චය කර ගැනීමට නිෂ්චිත නිර්නායකයන්ට එරෙහිව තක්සේරු කරයි. සමාගම එහි සියලු ම ආදායම්, සකස් කරගැනීම්, ප්‍රධානියා ලෙස (Principal) කටයුතු කරන බවට නිගමනය කර ඇත. ආදායම හඳුනාගැනීමට පෙර පහත විස්තර කරන නිශ්චිත හඳුනාගැනීම් නිර්නායකයන්ද යොදාගනී.

**භාණ්ඩ විකිණීම**

භාණ්ඩවල අයිතියේ වැදගත් අවදානම් හා වාසි ගැනුම්කරුට පැවරූ විට භාණ්ඩ විකුණුම් ආදායම හඳුනාගනු ලැබේ. එකී ආස්ථිත්‍යය සාමාන්‍යයෙන් අයිතිය) හා බැඳුනු අඛණ්ඩ කළමනාකාරිත්ව සහභාගීත්වය රඳවාගැනීම හෝ විකුණූ භාණ්ඩවලට ඵලදායී පාලනයක් හෝ තබාගනු නොලැබේ.

**පොලී ආදයම්**

සියලුම මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ. පොලී ධාරක මූල්‍ය වත්කම් විකිණීමට ඇති තොග ලෙස වර්ගීකරණය කෙරේ. පොලී ආදායම හෝ වියදම, සඵල පොලී අනුපාතය භාවිතා කරමින් (EIR) සටහන් කෙරේ. මෙම අනුපාතය ඇත්ත වශයෙන්ම ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හා ලැබීම් මූල්‍ය උපකරණවල අපේක්ෂිත ජීව කාලය හෝ කෙටිකාලයක් තුලින් සුදුසු පරිදි මූල්‍ය වත්කම් හෝ වගකීම්වල ශුද්ධ කාරක අගය දක්වා වට්ටම් කෙරේ. පොලී ආදායම, ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ ඇතුළත් කෙරේ.

**වත්කම් අපහරණයෙන් වාසි හෝ අවාසි**

වත්කම් අපහරණ ලාභ හෝ අලාභ තීරණය කරනු ලබන්නේ ශුද්ධ විකුණූ මුදල් අදාළ වත්කමේ සාධාරණ අගය සමග සැසඳීමෙනි. එය ලාභාලාභ ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කළ වත්කම් විකුණුවහොත් ප්‍රත්‍යාගණනය අතිරික්ත සංචිතයේ ඇති මුදල් ප්‍රමාණය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ.

### 2.2.3 බදුකරණය

**ප්‍රවර්තන බදු**

ආදායම් බදු වියදම, ප්‍රවර්තන ආදායම් බද්දෙන් සමන්විත වන අතර ආදායම් බදු වියදම ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එහෙත් හිමිකමට සෘජුව හඳුනාගන්නා ලද විෂයයන්, හිමිකම යටතේ හඳුනාගනු ලැබේ.

වාර්තාකරණ දිනට නීතිගත කළ බදු අනුපාතයන් භාවිතා කරමින් කාලපරිච්ඡේදයට අදාළ බදු අයකළ හැකි ආදායම මත ගෙවිය යුතු යැයි අපේක්ෂා කරන බද්ද ප්‍රවර්තන බද්ද වන අතර ඉකුත් වර්ෂවලට අදාළ ගෙවිය යුතු බදුවලට කරන ලද ගැලපුම්ද ඊට අයත්ය.

**විකුණුම් බදු**

පහත සඳහන් දෑ හැර ආදායම්, වියදම් සහ වත්කම් විකුණුම් බදුවලින් පසු ශුද්ධ අගයට හඳුනාගනු ලැබේ.

* වත්කම් හෝ සේවා මිලදී ගැනීමක් මත දැරූ විකුණුම් බදු, බදු බලධාරීන්ගෙන් අයකරගත නොහැකි වුවහොත් එවැනි අවස්ථාවලදී විකුණුම් බදු, වත්කම පවරාගැනීමේ පිරිවැයෙන් කොටසක් ලෙස හෝ යොදාගත හැකි පරිදි වියදම් විෂයක කොටසක් ලෙස හඳුනාගනු ලැබේ.

* ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් විකුණුම් බදු ඇතුළත් අගය සහිතව දක්වනු ලැබේ.

බදු බලධාරීන්ගෙන් හෝ බලධාරීන්ට අයවන හෝ ගෙවිය යුතු ශුද්ධ විකුණුම් බදු, මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි ලැබිය යුතු හෝ ගෙවිය යුතු මුදල්වල කොටසක් ලෙස ඇතුළත් කෙරේ.

**විලම්භිත බදු**

ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා වත්කම් හා වගකීම්වල සාධාරණ අගය හා බදු කාර්යය සඳහා භාවිතා කළ වටිනාකමෙහි තාවකාලික වෙනස බදු සඳහා වෙන්කරනු ලැබේ.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### 2.2.4 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් කාලපරිච්ඡේදය සඳහා ලාභය ගණන් ගැනීමේදී ආදායමට එරෙහිව අයකරනු ලැබේ.

අළුත්වැඩියාවන් හා අළුත්කිරීම්, එකී වියදම දැරූ කාලපරිච්ඡේදයේ ලාභයට හෝ පාඩුවට එරෙහිව අයකරනු ලැබේ.

### 2.2.4.1 ණයගැනීම් පිරිවැය

පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලබන සුදුසුකම් ලත් වත්කමක් වන පවරාගැනීමක්, ඉදිකිරීමක් හෝ නිෂ්පාදනයක් ඒවාට සෘජුවම ආරෝපනය (Attributable) කළ හැකි ප්‍රමාණයට හැර, ණය ගැනීම් පිරිවැය ඒවා දැරූ කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 2.2.4.2 මූල්‍ය පිරිවැය

ලාභාලාභ ගිණුමේදී හඳුනාගනු ලබන ණයගැනීම්වල පොලී වියදම මූල්‍ය පිරිවැයෙහි අන්තර්ගත වේ. සුදුසුකම්ලත් වත්කමක් වන පවරාගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනයක් සඳහා සෘජුව ආරෝපනය කළ නොහැකි ණයගැනීම් පිරිවැය, සඵල පොලී ක්‍රමය යොදාගෙන ලාභාලාභ ගිණුමේදී හඳුනාගනු ලැබේ.

විදේශ මුදල් වාසි හෝ අවාසි ශුද්ධ පදනම මත වාර්තා කරනු ලැබේ.

### 2.2.5 දේපල, පිරියත හා උපකරණ

**සමාගමට අයත් වත්කම්**

දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හා ඇතොත් හානිකරණ පාඩු අඩුකොට පිරිවැයට අගය කරයි. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට, එම වත්කම් අත්පත් කරගැනීමට සෘජුව ආරෝපිත වියදම් ඇතුළත් වේ. සමාගම විසින්ම ඉදිකරනු ලැබූ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිවැයට ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, එකී වත්කම අපේක්ෂිත භාවිතා කිරීමේ තත්වයට පත්කරන තුරු සෘජුවම ආරෝපනය කළ පිරිවැය යම් වත්කමක් තිබූ තැනින් කඩා ඉවත් කිරීමට හා ඒවා යථා තත්වයට පත්කිරීමට දැරූ පිරිවැය සහ සුදුසුකම් ලත් වත්කම්වල ණයගැනීම් පිරිවැය ඇතුළත් වේ. අදාළ උපකරණයක ක්‍රියාකාරීත්වය සම්බන්ධ මිලදී ගත් මෘදුකාංග පිරිවැය, උපකරණයේ පිරිවැය කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණයක කොටසක් එකිනෙක වෙනස් ඵලදායී ජීවන කාලයක් ඇතොත් ඒවා දේපල, පිරියත හා උපකරණ ලෙස (ප්‍රධාන සංරචකයන්) වෙනම ගිණුම්ගත කරනු ලැබේ.

**කල්බදු වත්කම්**

වැඩපිලිවෙලක් (Arrangement) තීරණය කර තිබුණත් එහි අඩංගු වුවත් කල්බද්දක්, වැඩපිලිවෙලෙහි අවශ්‍ය කොටසක් ලෙස ආරම්භක දිනයේදීම පත්වේ. වැඩපිළිවෙල ඉටුකරගැනීම නිශ්චිත වත්කම හෝ වත්කම්වල භාවිතය මත රඳා පවතී නම්, හෝ වැඩපිළිවෙලක අයිතිය නිශ්චිතව විස්තර කර නැතත් වැඩපිළිවෙල වත්කම භාවිතා කිරීමේ අයිතිය ඇති බව ප්‍රකාශවේ. කල්බදු වත්කමේ අයිතියට අනුෂාංගිකව විද්‍යාමාන වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සමාගමට පැවරෙන මූල්‍ය කල්බදු වලදී, කල්බදු දේපලෙහි, කල්බද්ද ආරම්භවන දිනට සාධාරණ අගය හෝ එය අඩුනම් අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය ප්‍රාග්ධනිත කරනු ලැබේ. කල්බදු ගෙවීම්, මූල්‍ය ගාස්තු හා කල්බදු වගකීමේ අඩුවීම අතර විභජනය කෙරේ. ඊට හේතුව වගකීමෙහි ඉතිරි ශේෂය මත පොලී අනුපාතය ස්ථාවරව පවත්වාගෙන යාම සාක්ෂාත් කරගැනීමයි. ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ගාස්තු මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනු ලැබේ. කල්බදු වත්කමක් එහි ඵලදායී ජීව කාලය තුල ක්ෂය කරනු ලැබේ. කෙසේ වෙතත්, කල්බදු කාලය අවසානයේදී සමාගමට අයිතිය ලබාගැනීමට සාධාරණ නිෂ්චිතතාවක් නැතිනම් වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය හෝ කල්බදු කොන්දේසි යන දෙකෙන් අඩු කාලය තුළදී ක්ෂය කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු ගෙවීම්, කල්බදු කොන්දේසි අනුව සරල මාර්ග පදනමට ලාභාලාභ ප්‍රකාශයේ මෙහෙයුම් වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

**පසු වියදම් (Subsequent expenditure)**

දේපල, පිරියත හා උපකරණවල අයිතමයක් නැතුව ප්‍රතිශ්ඨාපන පිරිවැය, එකී අයිතමයේ අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒවි යැයි විශ්වාස කරන විට සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මිනිය හැකි නම් එහි ධාරණ අගය හඳුනාගනු ලැබේ. ප්‍රතිශ්ඨාපනය කළ කොටස් ධාරණ අගය පහත දක්වා ඇති හඳුනාගැනීම ඉවත්කිරීමේ ප්‍රතිපත්තිය අනුව හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණවල එදිනෙදා සේවා පිරිවැය දැරූ ආකාරයට ලාභාලාභ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

**හඳුනාගැනීම ඉවත්කිරීම (De- recognition)**

දේපල, පිරියත හා උපකරණ විෂයක ධාරණ අගය අපහරණයකදී හෝ එය භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවන විට හඳුනාගැනීම ඉවත්කරනු ලැබේ. හඳුනාගැනීම ඉවත්කිරීමේ වාසි හෝ අවාසි ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එහෙත් වාසි (Gains) ආදායම් ලෙස වර්ග නොකෙරේ.

**ක්ෂය කිරීම**

දේපල, පිරියත හා උපකරණ අයිතමයක ක්ෂය, එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය ඇතුළත සරල මාර්ග ක්‍රමයට ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එනිසා වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පාරිභෝජන රටාව ඉතා ආසන්න වශයෙන් පිළිඹිබු වේ.

කල්බදු කාලසීමාව අවසානයේදී අයිතිය සාධාරණව සමාගමට හිමි නොවන බවට නිෂ්චිතතාවක් නැත්නම් මූල්‍ය කල්බදු යටතේ තබාගෙන ඇති වත්කම් කල්බදු කාලසීමාව සහ සමාන අයිති වත්කම්වල ඵලදායී ජීව කාලය යන දෙකින් අඩු කාලසීමාව ඇතුළත ක්ෂය කරනු ලැබේ. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්කමක ක්ෂය කිරීම එය භාවිතයට ගත්දා සිට කරනු ලබන අතර එකී වත්කම විකිණීමට තබා ඇති විට හෝ හඳුනා නොගන්නාසේ වර්ගකළ විට ක්ෂය කිරීම නතර කෙරේ.

වත්කමක සුන්බුන් වටිනාකම, ඵලදායී ජීවිත කාලය, ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කර සුදුසු වුවහොත් අනාගතයේදී බලාපොරොත්තු විය හැකි පරිදි ගලපනු ලැබේ.

**2.2.6 තොග - (Inventories)**

යල්පැනගිය සහ සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු අවසන් තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු මිලට අගය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම ගණනය කරනු ලබන්නේ, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී එය විකිණිය හැකි මිලෙන්, එය සම්පූර්ණ කිරීම සඳහා දරනු ලබන ඇස්තමේන්තු පිරිවැය සහ විකිණීම සඳහා දරනු ලැබිය හැකි ඇස්තමේන්තුගත පිරිවැය අඩුකිරීමෙනි.

තොග එහි වර්තමාන තත්වයට හා ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය, පහත සඳහන් සමීකරණ භාවිතා කරමින් ගිණුම්ගත කරනු ලැබේ.

| | |
|---|---|
| නිශ්පාදන තොග | - වාර්තාකරන දිනය දක්වා ඒමත දරන ලද පොදු කාර්ය පිරිවැය ඇතුළුව සෘජු පිරිවැයට |
| උක් දඬු | - වාර්තාකරන දිනය දක්වා දරන ලද පැල තවාන් පිරිවැය සහ ඒ මත දරන ලද පොදු කාර්ය පිරිවැයෙන් කොටසක් ඇතුළත් සෘජු පිරිවැයට |
| අනෙකුත් තොග | - තථ්‍ය වියදම |
| මාර්ගස්ථ තොග | - තථ්‍ය වියදම |

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### 2.2.7 මූල්‍ය උපකරණ

**i) මූල්‍යමය වත්කම්**

**මූලික හඳුනාගැනීම සහ අනතුරුව මැනීම**

පහත සඳහන් මූල්‍යමය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි විෂය පථය යටතේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස ලාභාලාභ ගිණුම හරහා වර්ගීකරණය කෙරේ. ණය සහ ලැබිය යුතු මුදල්, තබාගත් පරිනත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ඵලදායී ඉදිරි සුරැකුමක ව්‍යුත්පන්නයන් (derivatives) ලෙස හඳුන්වා දී ඇති ඉදිරි සුරැකුම් උපකරණ (Hedging instrument) උචිත ලෙස, මූලික හඳුනාගැනීමේදී සමාගම එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම්, ලාභාලාභ හරහා සාධාරණ වටිනාකමට සටහන් කරන ලද මූල්‍ය වත්කම් හැර මූලික වශයෙන් මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට ගනුදෙනු පිරිවැය එකතු කළ වටිනාකමට හඳුනාගනු ලැබේ. අලෙවි ස්ථානයේ රෙගුලාසි හෝ සම්ප්‍රදායානුකූලව ස්ථාපිත කරන ලද කාලසීමාව තුළ වත්කම් බෙදාහැරීමේ අවශ්‍යතාව ඇති විට මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකුණුම්, විකුණුම් දිනයේදී හඳුනාගනු ලැබේ. උදා :- සමාගම වත්කම මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳුනු දිනය

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්, ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

**පසු මිණුම (Subsequent Measurement)**

මූල්‍ය වත්කම්වල පසු මිනුම පහත විස්තර කර ඇති වර්ගීකරණය මත සිදු කෙරේ.

**ණය සහ ලැබිය යුතු මුදල්**

ණය සහ ලැබිය යුතු මුදල් කිසිඳු වෙළඳපොලක ලැයිස්තුගත නොකරන, ස්ථාවර හෝ තීරණය කරනු ලබන ගෙවීම් සහිත ව්‍යුත්පත්ති නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුමින් පසු එවැනි මූල්‍ය වත්කම් EIR ක්‍රමය භාවිතා කරමින් (සඵල පොලී අනුපාතය) හානිකරණය අඩුකොට ක්‍රමක්ෂය පිරිවැයට පසුව මිනුම් කරනු ලැබේ. ක්‍රම ක්ෂය ගණනය කරනු ලබන්නේ, පවරා ගැනීමේදී ගෙවූ වට්ටම් හෝ වාරික සැලකිල්ලට ගනිමින් සහ EIR හි සම්බන්ධිත කොටසක් වන ගාස්තු හා පිරිවැය ගණන් ගැනීමෙනි. ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ආදායම් ලෙස EIR හි ක්‍රම ක්ෂය ඇතුළත් කෙරේ.

**හඳුනා නොගැනීම (De-recognition)**

මූල්‍ය වත්කම් (හෝ භාවිතා කළහොත්, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පහත සඳහන් අවස්ථාවලදී හඳුනාගනු නොලැබේ.

* වත්කම්වලින් මුදල්, ලැබීමට අයිතිය ඇති කල් ඉකුත් වූ විට

* සමාගම වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන්ගෙන් ලැබෙන මුදල්වල එහි අයිතිය මාරුකිරීම හෝ හරහා යන වැඩපිළිවෙල යටතේ (”Pass-through” arrangement) ලද මුදල් ප්‍රවාහයන් සම්පූර්ණයෙන්ම වැඩි ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට ගෙවීමට වගකීමක් ඇතැයි උපකල්පනය කිරීම. එහිදී,

    (අ) සමාගම වත්කමේ විද්‍යාමාන වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ මාරුකරනු ලැබේ. නැතහොත්,
    (ආ) සමාගම වත්කමේ විද්‍යාමාන වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ මාරු කරන්නේ හෝ තබා ගැනීම හෝ නොකරයි. එහෙත් වත්කමේ පාලනය පවරා දෙයි.

සමාගම වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය පවරා ඇති විට හෝ වැඩපිළිවෙල හරහා යාමට එකඟ වී ඇතිවිට, අයිතියේ අවදානම හා ප්‍රතිලාභ කොපමණ ප්‍රමාණයකට රඳවා ගන්නවාද යන්න ගැන ඇගයීමක් කරයි. එය මාරුකිරීමක් හෝ වත්කමේ විද්‍යාමාන වන සියලු අවදානම් සහ ප්‍රතිලාභ රඳවා ගැනීමක් නොකරන විට, වත්කමේ පාලනයද මාරු නොකරයි. එහිදී, වත්කමේ අඛණ්ඩ සමාගමේ මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම හඳුනා ගනී. එවැනි අවස්ථාවක සමාගම වත්කමේ අන්තර්ගත වගකීමද හඳුනා ගනී. මාරුකළ වත්කම හා ආශ්‍රිත වගකීම, සමාගම තබාගන්නා අයිතිය හා වගකීම නිරූපනය වන පදනමක් යටතේ මනිනු ලැබේ.

මාරු කරන ලද වත්කමේ අඛණ්ඩ මැදිහත් වීම ඇපයක (Guarantee) ස්වභාවයක් ගත්විට වත්කමේ මුල් ධාරණ වටිනාකම සහ සමාගම ආපසු ගෙවීම අවශ්‍ය වූ ප්‍රතිශ්ඨාවේ උපරිම අගය යන දෙකෙන් අඩු වටිනාකමට මනිනු ලැබේ.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

**මූල්‍ය වත්කම් හානිකරණය (Impairment of financial Assets)**

සමාගම, එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ වත්කම් කණ්ඩායමක් හානිකරණය වේද යන්න ගැන යම් අරමුණුගත සාක්ෂි තිබේදැයි බලයි. මූල්‍ය වත්කමක් හෝ වත්කම් කණ්ඩායමක් හානිකරණය කළ යුතුයැයි අදහස් කළහොත් වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසු සිදුවූ සිදුවීමක් හෝ සිදුවීම් හේතුකොට ගෙන හානිකරණ පිළිබඳ අරමුණු සහගත සාක්ෂි ඇතොත් (සිදු වූ හානි සිද්ධියක්) සහ එකී හානි සිදුවීම හෝ සිදුවීම්වලින් මූල්‍ය වත්කමක හෝ සමූහයක අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් වෙතොත් එය විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කළ හැක. හානිකරණ සාක්ෂිවලට ඇතුළත් වන්නේ ණයගැතියකු හෝ ණයගැතියන් බරපතල ලෙස මූල්‍ය දුෂ්කරතාවලට පත්වීම, පොලී හෝ මූලික ප්‍රාග්ධනය නොගෙවා සිටීම හෝ යුතුකම් පැහැර හැරීම, ඔවුන් බංකොලොත් බවට පත්විය හැකි සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් කිරීම සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහවල මිනිය හැකි අඩු වීමක් පිළිබිඹු වීම එනම්, හිඟ මුදල්වල හෝ ගෙවීම් පැහැර හැරීම් හා සම්බන්ධ ආර්ථික තත්වයන්වල වෙනස්වීම් ක්‍රම ක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් සඳහා සමාගම මුලින්ම එක් එක් මූල්‍ය වත්කමට වැදගත් වන හෝ මූල්‍ය වත්කම්වලට සාමූහිකව වැදගත් නමුත් එක් එක් වත්කමට වැදගත් නොවන හානිකරණ අරමුණු සාක්ෂි තිබේදැයි තක්සේරු කරයි. සමාගම හානිකරණ අරමුණු සාක්ෂි තනි තනිව තක්සේරු කළ මූල්‍ය වත්කමට නැති බවට තීරණය කළහොත්, වැදගත් වුවත් නැතත් එය සමාන ණය අවදානම් ඇති මූල්‍ය වත්කම් කණ්ඩායමේ වත්කමක් ලෙස ඇතුළත් කර ඒවා සාමූහිකව හානිකරණය සඳහා තක්සේරු කෙරේ. හානිකරණය සඳහා වෙන් වෙන්ව තක්සේරු කරන වත්කම් සහ හඳුනාගත් හානිකරණ පාඩුවක් හෝ අඛණ්ඩව සිදුවන පාඩුවක් සාමූහික හානිකරණ තක්සේරුවක ඇතුළත් කරනු නොලැබේ.

හානිකරණ පාඩුවක් සිදුවූ බවට අරමුණු සාක්ෂි ඇතොත් පාඩුවේ වටිනාකම වත්කමේ ධාරණ වටිනාකම සහ අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහවල වර්තමාන අගය යන දෙකේ වෙනස ලෙස මනිනු ලැබේ. (මේ දක්වා සිදු නොවුණු අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවායන්හි වර්තමාන අගය මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ. ණය මුදලකට විචල්‍ය පොලී අනුපාතයක් ඇතොත්, යම් හානිකරණ පාඩුවක් මිණීම සඳහා භාවිතා කරන වට්ටම් අනුපාතය වන්නේ වර්තමාන සඵල පොලී අනුපාතයයි. (EIR) වත්කමේ ධාරණ අගය දීමනා ගිණුම හරහා (Allowance account) අඩුකරන අතර පාඩු වටිනාකම ලාභාලාභ ප්‍රකාශයෙන් හඳුනාගනු ලැබේ ලැබිය යුතු ගිණුම්, ආශ්‍රිත දීමනා සමඟ අනාගතයේදී ඇත්ත වශයෙන්ම අයවීමක් බලපොරොත්තු විය නොහැකි නිසා කපාහරිනු ලැබේ. සියලුම සමාන දෑ (collateral) උපලබ්ධි වී හෝ සමාගමට මාරුකර ඇත. හානිකරණය හඳුනාගැනීමෙන් පසු යම් සිදුවීමක් හේතුකොටගෙන, පසු වර්ෂයකදී ඇස්තමේන්තුගත හානිකරණ පාඩුව අඩු හෝ වැඩි වුවහොත් මුලින් හඳුනාගත් හානිකරණ පාඩුව, දීමනා ගිණුමින් ගැලපීම මඟින් අඩු හෝ වැඩි කරනු ලැබේ. අනාගත කපාහැරීමක් පසුව අයකරගත හොත් එම මුදල ලාභාලාභ ප්‍රකාශයේ නිරූපනය කරනු ලබයි.

**මූල්‍ය වගකීම්**

**මූලික හඳුනාගැනීම හා මිනුම**

ශ්‍රී.ලං.ගි.ප්‍ර.39 හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් සාධාරණ අගයට ලාභාලාභ ගිණුම, ණය සහ ණය ගැනීම්, සඵල ඉදිරි සුරැකුම් (Hedging) ක, ඉදිරි සුරැකුම් උපකරණ ලෙස ව්‍යුත්පත්තයන් (derivatsve) හරහා උචිත පරිදි ලෙස මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගම මූල්‍ය වගකීම් වර්ගීකරණය ආරම්භක හඳුනාගැනීමේදී තීරණය කරනු ලබයි. සියලු මූල්‍ය වගකීම් සාධාරණ අගය සහ ණය සහ ණයගැනීම්වලට අදාල සෘජු ගනුදෙනු පිරිවැය සමග ආරම්භයේදී හඳුනා ගනු ලැබේ.

සමාගමේ මූල්‍ය වගකීම් තුල ගෙවියයුතු වෙළඳ සහ අනෙකුත් දෑ, බැංකු අයිරා සහ ණය සහ ණයගැනීම් ඇතුලත් වේ.

**පසු මිණුම් (Subsequent Measurement)**

මූල්‍ය වගකීම් මිනීම පහත විස්තර කර ඇති පරිදි ඒවායෙහි වර්ගීකරණය පදනම් කරගෙන කරයි.

**ණය සහ ණයට ගැනීම් (Loans and Borrowings)**

මූලික හඳුනාගැනීමෙන් පසු පොලී දරන ණය සහ ණය ගැනීම්, EIR ක්‍රමය භාවිතා කොට ක්‍රම ක්ෂය පිරිවැයට පසුව මනිනු ලැබේ. EIR ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා නොගත් විට වාසි සහ අවාසි ලාභාලාභ ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ.

පවරාගැනීමක් මත යම් වට්ටමක් හෝ වාරිකයක් හෝ EIR හා සම්බන්ධිත කොටසක් ලෙස සලකන ගාස්තු හා පිරිවැය ගණන්ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ. EIR ක්‍රමක්ෂය, ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ ඇතුලත් කරයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

**හඳුනා නොගැනීම (De-recognition)**

වගකීමක් යටතේ වූ බැඳීම නිදහස් කළහොත් හෝ අවලංගු කළහොත් හෝ කල් ඉකුත් වුවහොත් එම මූල්‍ය වගකීම හඳුනාගනු නොලැබේ. පවත්නා මූල්‍ය වගකීමක් එම ණයදෙන්නා සමගම සැලකිය යුතු වෙනස් වූ කොන්දේසි මත වෙන එකක් ප්‍රතිශ්ඨාපනය කළහොත් හෝ පවත්නා කොන්දේසි සැලකිය යුතු ලෙස නවීකරණය කළහොත් එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක්, මුල් වගකීම හඳුනා නොගැනීමක් ලෙස සලකා නව වගකීම හඳුනාගනියි. අදාළ ධාරණ වටිනාකමෙහි වෙනස ලාභාලාභ ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ.

**2.2.8 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් හා මුදල් සමාන දෑ වලට අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු ඇතුලත් වන අතර ඒවා ඕනෑම වේලාවක දන්නා මුදල් බවට පරිවර්තනය කළ හැකි අතර ඒවා වටිනාකමෙහි වෙනස්වීමක් පිළිබඳ වැදගත් අවදානමකට යටත් නොවේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ වලට පහත සඳහන් දෑ ඇතුළත්ය. අතැති මුදල්, බැංකු තැන්පතු, හිඟ බැංකු අයිරාවල ශුද්ධ වටිනාකම.

**2.2.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය (Impairment of financial Assets)**

හානිවීම සඳහා යම් ඇඟවීමක් තිබේදැයි තීරණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සමාගමේ වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබුණහොත්, වත්කමේ අයවිය යුතු මුදල ඇස්තමේන්තු කරනු ලැබේ.

වත්කමක අයකරගත හැකි මුදල් හෝ මුදල් උපයන ඒකකය වන්නේ එය භාවිතයේදී පවතින අගය සහ විකිණීමට දරන පිරිවැය අඩු කළ එහි සාධාරණ අගය යන දෙකෙන් වැඩි අගයයි. භාවිතා කරන වටිනාකම තක්සේරු කිරීමේදී බදු පූර්ව වට්ටම් අනුපාතය යොදාගෙන ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායෙහි වර්තමාන අගයන්ට වට්ටම් කරනු ලැබේ. එයින් මුදලේ වර්තමාන තක්සේරු කාලීන වටිනාකම සහ එම වත්කමට නිශ්චිත අවදානම නිරූපනය වේ. මුදල් උපයන ඒකකය වන්නේ වෙනත් වත්කම් හෝ සමූහයෙන් බොහෝ දුරට නිදහස් මුදල් ප්‍රවාහයන් උපයන හඳුනාගත හැකි කුඩාම වත්කම් සමූහයයි.

වත්කමක ධාරන වටිනාකම හෝ එහි මුදල් උපයන ඒකකය එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ පාඩුවක් හඳුනාගනී. හානිකරණ පාඩු ලාභාලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ. මුදල් උපයන ඒකකයක හානිකරණ පාඩුවක් හඳුනාගත හොත් පළමුව එකී ඒකකයට වෙන්කළ යම් කීර්තිනාමයක (Goodwill) ධාරන වටිනාකම අඩුකිරීමට සහ පසුව එම ඒකකයේ වෙනත් වත්කම්වල ධාරණ අගය අඩුකිරීම සමානුපාතිකව (pro rate basis) පදනම යටතේ සිදු කෙරේ.

**2.2.10 වගකීම් සහ ප්‍රතිපාදන**

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම්, ඉල්ලූ විගස හෝ වාර්තාකරණ දිනයේ සිට වර්ෂයක් ඇතුළත ගෙවීමට සිදුවන වගකීම් වන අතර ජංගම නොවන වගකීම්, වාර්තාකරණ දිනෙන් වර්ෂයකට පසුව ගෙවීමට සිදුවන වගකීම් වේ.

සියලුම දන්නා වගකීම්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන විට ගිණුම්ගත කරනු ලැබ ඇත.

**2.2.10.1 සේවක ප්‍රතිලාභ**

**නිශ්චිතදායක සැලැස්ම (Defined contribution plan)**

නිශ්චිතදායක සැලැස්මක්, පසු- සේවක ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ එක් ආස්ථිත්‍යයක් වෙනම ඇති ආස්ථිත්‍යයකට ස්ථිර දායක මුදල් ගෙවන අතර ඉන්පසු තවදුරටත් මුදල් ගෙවීමට කිසිඳු නෛතික හෝ ගිණුම්ගත සවිමත් බැඳීමක් නැත. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සියලුම සේකයින් ආවරණය වන පරිදි කෙරෙන දායක මුදල් වගකීම එය දැරූ විට ලාභාලාභ ප්‍රකාශයට වියදමක් ලෙස හඳුනාගැනේ. සමාගම සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වේ.

**නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම (Defined Benefit Plans)**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිතදායක සැලැස්මක් හැර පසු-සේවක ප්‍රතිලාභ සැලැස්මකි. (Post-employment benefit plan) නිශ්චිත ප්‍රතිලාභ ගණනය කරනු ලබන්නේ ස්වාධීන ආයුගණකවරුන් විසිනි. (Actuaries) නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙන් වර්තමාන අගය නිශ්චය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් වර්ගයට නම්කරන ලද (Denominated) පොලී අනුපාතයට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම් වට්ටම් කිරීමෙනි. ඒ සඳහා අදාළ වගකීමෙහි කොන්දේසි ආසන්න කරමින් කල්පිරීමට කොන්දේසි ඇත.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

**මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම, උපකල්පන රාශියක් භාවිතා කරමින් ආයුගණක පදනමකින් නිශ්චය කරන ලද සාධක රාශියක් මත පදනම් වේ. නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 19.1 හි සඳහන් වේ. එකී උපකල්පනවලට කරනු ලබන වෙනස්කිරීම්, නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල ධාරණ වටිනාකමට බලපායි.

නිශ්චිත ප්‍රතිලාභ වගකීම් සඳහා ආයුගණක වාසි හෝ අවාසි, ඒවා සිදුවූ කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණයෙන්ම වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගැනේ. එවැනි ආයුගණක වාසි හෝ අවාසි ද වහාම රඳවාගත් ඉපැයීම් වලට හඳුනාගන්නා අතර පසු කාලපරිච්ඡේදයන් සඳහා ලාභාලාභ ගිණුමට යළි වර්ගීකරණය කරනු නොලැබේ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයින්ගේ පළමු සේවා වර්ෂයේ සිට කරනු ලැබ තිබේ. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව, සේවකයකුගේ වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් පසුවයි.

වගකීම බාහිරව අරමුදල් කර නැත.

**කෙටිකාලීන ප්‍රතිලාභ (Short-term benefits)**

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වගකීම්, වට්ටම් නොකළ පදනමට මනිනු ලබන අතර අදාල සේවා කාලයට කරන ලද ප්‍රතිපාදනය වියදමක් සේ සලකයි.

**2.2.10.2 රජයේ ප්‍රදානය (Government grants)**

2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හා ඌන උපයෝජිත වත්කම් පුනස්ථාපන පනත බලාත්මක වීමත් සමඟ (Revival of underperforming Enterprises and underutilised Assets Act No.43 of 2011) ශේෂපත්‍රයේ පිළිඹිබු වන රජයේ ප්‍රදාන පවරාගත් ශුද්ධ වටිනාකමින් සමන්විත වේ. පසුව එකී ආස්ථිත්‍යයේ මෙහෙයුම් කටයුතු කරගෙන යාම සඳහා කාරක ප්‍රාග්ධනයයෙන් දායක වේ.

**2.2.10.3 ප්‍රතිපාදන**

ඉකුත් සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇතොත්, ප්‍රතිපාදනයක් හඳුනාගනී. සමාගමට දැනට නෛතික හා සවිමත් වගකීමක් ඇති අතර එය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිය. සහ ආර්ථික ප්‍රතිලාභවල සම්පත් පිටතට ගලායාමක් අන්තර්ගතව ඇති බවට සම්භාවිතාවක් ඇති නිසා වගකීම නිරවුල් කිරීම අවශ්‍ය විය හැක.

**2.2.10.3.1 ගොවි ණය වෙන් කිරීම්**

සමාගම උක් ගොවින් සඳහා මධ්‍ය කාලීන සහ කෙටි කාලීන ණය ලබා දෙන අතර අඩමාන ණය සඳහා වෙන් කිරීම පහත පරිදි සිදු කරයි. වසර 03 කට වඩා හිඟහිටි කෙටි කාලීන ණය වෙනුවෙන් සහ වසර 05 කට වඩා හිඟහිටි මධ්‍ය කාලීන ණය වෙනුවෙන් සම්පූර්ණ වෙන් කිරීමක් සිදු කරයි.

**2.2.11 ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කිරීම**

යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂය සමඟ සංගත වේ.

**2.3 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතා කිරීම**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයට සටහන් කරන ලද ආදායම්, වියදම්, වත්කම්, වගකීම් හා අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම්වලට බලපාන විනිශ්චයන්, ගැලපීම්, ඇස්තමේන්තු හා උපකල්පන කිරීමට කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, එවැනි උපකල්පන හා ඇස්තමේන්තුවලට අවිනිශ්චිතතාවේ ප්‍රතිඵල හේතුවෙන් අනාගත කාලපරිච්ඡේදවලට බලපාන වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවිය හැකිය.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීමේදී අවස්ථාවෝචිතව සාධාරණයැයි විශ්වාසකරන අපේක්ෂාවන් ඇතුළුව ඓතිහාසික පළපුරුද්ද හා වෙනත් සාධක පදනම් වේ. එබැවින් තථ්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල එම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු හා සඳහන් කළ උපකල්පන කෙරීගෙන යන පදනමින් සමාලෝචනය කෙරේ. සංශෝධන එම කාලපරිච්ඡේදයට හා යම් අනාගත කාලපරිච්ඡේදයකට පමණක් බලපායි නම් ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කරන සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හඳුනා ගනු ලැබේ.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම් ක්‍රියාවලියේදී, අනාගතයට අදාළව කරන ලද ප්‍රධාන උපකල්පන සහ වාර්තාකරණ දිනට ඇස්තමේන්තු ප්‍රභවයන් සහ ඊළඟ වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට හේතුවන වැදගත් අවදානමක් ඇති අදාළ ගැලපුම් පහතින් සාකච්ඡා කෙරේ.

සීමාාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක ධාරණ වටිනාකම, එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවන විට සහ එහි සාධාරණ වටිනාකමින් විකිණීමට දැරූ පිරිවැය අඩුකොට සහ එහි භාවිතා වන වටිනාකම යන අගයෙන් වැඩි අගයක් ඇති විට හානිකරණයක් පවතී. විකිණීමට දැරූ පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම ගණනය කිරීමට පදනම් වන්නේ සමාන වත්කම්වල තමාගේ ප්‍රයෝජනය තකා කරගන්නා (Arm's length transactions) අනුගම්‍ය විකුණුම් ගනුදෙනු (Binding sales transactions) වලින් පවත්නා දත්ත හෝ නිරීක්ෂණය කළහැකි වෙළඳපොල වටිනාකමින් වත්කම අපහරණය කිරීමට දැරූ පිරිවැය අඩුකළ වටිනාකම මතයි. භාවිතා කරන වටිනාකම (Value in use) ගණනය කිරීමට පදනම් වන්නේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමයයි. තක්සේරු කිරීමේ කාර්යය සඳහා භාවිතා කරන වර්ධන අනුපාතය සහ අපේක්ෂිත අනාගත මුදල් ඇතුලට ගලාඒම් මෙන්ම අයවිය යුතු මුදල් වට්ටම් කළ මුදල් ප්‍රවාහ මාදිලිය (Model) සඳහා භාවිතා කළ වට්ටම් අනුපාතයට වඩාත් සංවේදී වේ.

### දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය

දේපල, පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය සහ සුන්බුන් වටිනාකම අපේක්ෂිත වත්කම පාවිච්චි කරන කාලය සහ එකී වත්කම්වල ආර්ථික ජීවකාලය පදනම් කරගෙන කළමනාකාරීත්වය නියම කරයි. තාක්ෂණික දියුණුව හෝ වත්කම් භාවිතය වැනි අවස්ථාවල පසුව කරනු ලබන වෙනස්වීම් හේතුකොට ගෙන තථ්‍ය ඵලදායී ජීව කාලය හෝ සුන්බුන් වටිනාකම මුල් ඇස්තමේන්තුවෙන් වෙනස් වේ. දේපල, පිරියත හා උපකරණවල ප්‍රධාන විෂයයන්වල සුන්බුන් අගය සහ ඵලදායී ජීව කාලය කළමනාකාරීත්වය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ.

### ලැබිය යුතු මුදල්වල හානිකරණය

සමාගම සෑම වාර්තාකරණ දිනකම යම්කිසි දීමනාවක් ලාභාලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කළ යුතුද යන්න තක්සේරු කිරීම සඳහා සියලුම ලැබිය යුතු මුදල් සමාලෝචනය කරයි. හිඟ මුදල්වල කාලසීමාව සහ අයකරගැනීම අවිනිශ්චිත බවට කළමනාකාරීත්වය දැනුවත් බව ඇඟවීම වැනි වෙනත් සාධකද සැලකිල්ලට ගනිමින් එවැනි දීමනාවක් ඇස්තමේන්තු කිරීමට කළමනාකාරීත්වය විනිශ්චයක් භාවිතා කරයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### 4. ආදායම්

**4.1** සාරාංශය

| | 2023 රුපියල් | 2022 රුපියල් |
|---|---|---|
| භාණ්ඩ විකුණුම් | 16,095,088,733 | 19,287,059,633 |
| | 16,095,088,733 | 19,287,059,633 |

**4.2** ආදායම පහත පරිදි උපයා ඇත.

| | 2023 රුපියල් | 2022 රුපියල් |
|---|---|---|
| සීනි | 10,025,896,548 | 9,325,955,975 |
| මොලැෂස් | 456,658,828 | 13,431,087 |
| ඊඑන්ඒ | 5,612,533,357 | 9,947,672,571 |
| විෂ බීජ නාශක දියර | - | |
| | 16,095,088,733 | 19,287,059,633 |

**4.3** බණ්ඩ තොරතුරු

| | ප්‍රධාන කාර්යාලය රුපියල | පැල්වත්ත අංශය රුපියල් | සෙවනගල අංශය රුපියල් | ඉවත්කිරීම රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|---|---|
| **බණ්ඩ ආදායම** | 56,400,000 | 10,579,181,490 | 5,515,907,243 | (56,400,000) | 16,095,088,733 |
| **බණ්ඩ ප්‍රතිඵල** | | | | | |
| දල ලාභය/ (අලාභය) | 56,400,000 | 2,810,751,331 | 2,770,151,374 | (56,400,000) | 5,580,902,705 |
| **වෙනත්** | | | | | |
| ප්‍රාග්ධන වියදම් | 626,045 | 988,281,843 | 977,462,452 | - | 1,966,370,340 |
| ක්ෂය | 790,689 | 288,148,413 | 156,325,696 | - | 445,264,798 |
| **බණ්ඩ වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | 12,393,068 | 2,384,169,491 | 1,244,431,164 | - | 3,640,993,723 |
| ජංගම වත්කම් | 172,553,220 | 7,795,765,100 | 8,130,039,663 | (1,111,786,427) | 14,986,571,556 |
| **බණ්ඩ වගකීම්** | | | | | |
| ජංගම නොවන වගකීම් | 866,835 | 1,458,916,222 | 443,193,089 | - | 1,902,976,146 |
| ජංගම වගකීම් | 244,370,963 | 3,492,033,147 | 2,790,466,371 | (1,111,786,427) | 5,415,084,054 |

### 5. වෙනත් ආදායම් හා ලැබීම්

| | 2023 රුපියල් | 2022 රුපියල් |
|---|---|---|
| වෙනත් සේවා ආදායම | 135,300,917 | 175,430,759 |
| විවිධ ආදායම් | 97,972,876 | 31,619,163 |
| | 233,273,792 | 207,049,922 |

### 6. මූල්‍ය පිරිවැය හා ආදායම

**6.1 මූල්‍ය පිරිවැය**

| | 2023 රුපියල් | 2022 රුපියල් |
|---|---|---|
| බැංකු ණය මත පොලී වියදම් | 33,592,329 | 48,865,753 |
| බැංකු අයිරා මත පොලී වියදම් | 15,749,344 | 6,162,674 |
| කල්බදු වගකීම් මත මූල්‍ය ගාස්තු | 19,779,068 | 32,309,967 |
| | 69,120,741 | 87,338,394 |

**6.2 මූල්‍ය ආදායම්**

| | 2023 රුපියල් | 2022 රුපියල් |
|---|---|---|
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | 656,478,858 | 541,534,373 |
| අනෙකුත් පොලී අදායම් | 8,170 | 2,720 |
| | 656,487,028 | 541,537,093 |

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### 7. බදුවලට පෙර පාඩුව පහත දෑ අයකිරීමෙන් පසු ප්‍රකාශ කර ඇත.

| | 2023<br>රුපියල් | 2022<br>රුපියල් |
|---|---|---|
| විකුණුම් පිරිවැය තුළ ඇතුළත්ය | | |
| පහත සඳහන් දෑ ඇතුළත් සේවක ප්‍රතිලාභ | | |
| නිශ්චිතදායක සැලසුම් පිරිවැය - EPF & ETF | 392,479,052 | 323,336,509 |
| ක්ෂය | 348,644,028 | 378,551,821 |
| ගොවි ණය මත බොල් ණය | (1,263,414) | (3,618,596) |
| **පරිපාලන වියදම් තුල ඇතුලත්** | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | 206,389,343 | 122,173,101 |
| නිශ්චිතදායක සැලසුම් පිරිවැය - EPF & ETF | 125,957,579 | 103,415,629 |
| ක්ෂය | 95,830,086 | 86,146,079 |
| කළමණාකරන ගාස්තු | 56,400,000 | 48,300,000 |
| විගණන ගාස්තු | 960,000 | 850,000 |

### 8. ආදායම් බදු වියදම් (ප්‍රතිවර්තන)

| | 2023<br>රුපියල් | 2022<br>රුපියල් |
|---|---|---|
| ප්‍රතිවර්තන ආදායම් බදු | 339,065,670 | 901,348,746 |
| විලම්බිත බදු ගාස්තු (ප්‍රතිවර්තන)(8.2 සටහන) | 163,771,572 | 230,153,903 |
| | 502,837,242 | 1,131,502,649 |

### 8.1 ප්‍රවර්තන බදු වියදම (ආදායම) සහ ගිණුම්කරණ ලාභ/ (පාඩු) නිමැවුම අතර සැසඳීම

| | 2023 | 2022 |
|---|---|---|
| බද්දට පෙර ගිණුම්කරණ ලාභ/ (පාඩු) | 2,835,118,969 | 6,045,575,871 |
| ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපුම් | - | (2,573,877,312) |
| බද්දට පෙර ගලපන ලද ගිණුම්කරණ ලාභය/ (පාඩුව) | - | 3,471,698,559 |
| සමාහාර ඉඩනොදුන් අයිතම | - | 451,904,703 |
| සමාහාර ඉඩදුන් අයිතම | - | (256,005,921) |
| බදු කටයුතු සඳහා ව්‍යාපාර ලාභය/ (පාඩුව) | - | (704,179,471) |
| | - | 2,963,417,870 |
| **අඩු කලා : ව්‍යාපාරික අලාභය** | | - |
| තක්සේරු කළ හැකි මුළු ව්‍යාපාරික ආදායම | 1,130,218,899 | 2,963,417,870 |
| තක්සේරු කළ හැකි මුළු ආයෝජන ආදායම | - | 704,179,471 |
| තක්සේරු කළ හැකි මුළු ආදායම | 1,130,218,899 | 3,667,597,341 |
| වර්ෂය තුළ උපයෝජනය කළ බදු අලාභ | | - |
| බදු අයකළ හැකි ආදායම | 1,130,218,899 | 3,667,597,341 |
| 18% බැගින් ආදායම් බදු | - | 266,707,608 |
| 24% බැගින් ආදායම් බදු | - | 84,501,536 |
| 30% බැගින් ආදායම් බදු | 339,065,670 | 550,139,602 |
| | 339,065,670 | 901,348,746 |

### 8.2 විලම්බිත බදු වත්කම්

| | මූල්‍ය තත්ව ප්‍රකාශ | | ලාභ/අලාභ ප්‍රකාශ | |
|---|---|---|---|---|
| | 2023<br>රුපියල් | 2022<br>රුපියල් | 2023<br>රුපියල් | 2022<br>රුපියල් |
| විලම්බිත බදු වගකීම | | | | |
| දේපල, පිරියත හා උපකරණ මත | (1,081,275,232) | (823,667,805) | 257,607,427 | 363,828,290 |
| | (1,081,275,232) | (823,667,805) | 257,607,427 | 363,828,290 |
| විලම්බිත බදු වත්කම් | | | | |
| දේපල, පිරියත හා උපකරණ මත | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම මත | 335,414,815 | 244,372,206 | (91,042,609) | (137,992,652) |
| බදු අලාභ / ප්‍රතිපාදන | 1,707,668 | (1,085,579) | (2,793,247) | 4,318,265 |
| | 337,122,483 | 243,286,627 | (93,835,856) | (133,674,387) |
| | | | 163,771,571 | 230,153,903 |
| විලම්බිත ආදායම් බදු ප්‍රතිවර්තනය | - | - | | |
| ශුද්ධ විලම්බිත බදු වත්කම | (744,152,749) | (580,381,178) | | |

### 9. කොටසක ඉපැයීම් (පාඩුව)

9.1 වර්ෂය තුළ හිඟව පැවති සාමාන්‍ය කොටස් ප්‍රමාණයේ හරිත සාමාන්‍යයෙන් කොටස් හිමියන්ට ආරෝපනය කළ වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ (පාඩුව) බෙදා මූලික කොටසක ඉපැයීම් (පාඩුව) ගණන් බලා ඇත.

**9.2 ලවය ලෙස භාවිතා කළ මුදල**

| | 2023<br>රුපියල් | 2022<br>රුපියල් |
|---|---|---|
| කොටසක ඉපැයීම් සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය කළ ශුද්ධ ලාභය/ (පාඩුව) | 2,332,281,727 | 4,914,073,222 |

| | 2023<br>Number | 2022<br>Number |
|---|---|---|
| **හරය ලෙස භාවිතා කළ සාමාන්‍ය කොටස් ප්‍රමාණය** | | |
| මූලික කොටසක ඉපැයීම් (පාඩුව) සඳහා යොදා ගත යුතු සාමාන්‍ය කොටස්වල හරිත සාමාන්‍ය | 100 | 100 |

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

## මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර වෙනුවෙන්

### 10. දේපල, පිරියත හා උපකරණ

#### 10.1 දල ධාරණ වටිනාකම

| | 2023.01.01 දිනට ශේෂය රුපියල් | එකතුකිරීම්/ මාරුකිරීම් රුපියල් | අපහරණයන්/ මාරුකිරීම් රුපියල් | 2023 .12.31 දිනට ශේෂය රුපියල් |
|---|---|---|---|---|
| ඉඩම් | 44,149,728 | - | - | 44,149,728 |
| ඉඩම් සංවර්ධනය | 188,466,925 | - | - | 188,466,925 |
| කම්හල් ගොඩනැගිලි | 244,364,780 | - | - | 244,364,780 |
| වෙනත් ගොඩනැගිලි | 276,472,685 | - | - | 276,472,685 |
| ක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ | 707,527,983 | 106,727,151 | - | 814,255,134 |
| වාරිමාර්ග සහ විවිධ උපකරණ | 268,176,442 | 10,957,131 | - | 279,133,573 |
| කම්හල් පිරියත හා උපකරණ | 3,328,739,217 | 253,709,085 | - | 3,582,448,302 |
| වෙනත් පිරියත හා උපකරණ | 153,158,403 | - | - | 153,158,403 |
| ගබඩා ටැංකි | 63,398,475 | - | - | 63,398,475 |
| මාර්ග හා පාලම | 111,855,516 | - | - | 111,855,516 |
| රසායනාගාර උපකරණ | 49,291,526 | - | - | 49,291,526 |
| මෝටර් වාහන | 228,172,205 | 27,936,245 | - | 256,108,450 |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | 223,657,970 | 30,680,344 | - | 254,338,315 |
| නිරවුල් කලාප පොදු පහසුකම් | 73,193,739 | - | - | 73,193,739 |
| | 5,960,625,594 | 430,009,956 | - | 6,390,635,550 |
| **මූල්‍ය කල්බදු වත්කම්** | | | | |
| මෝටර් රථ | 53,645,000 | - | - | 53,645,000 |
| හොලන්ඩ් ට්‍රැක්ටර් | - | - | - | - |
| ට්‍රැක්ටර් | 136,867,000 | - | | 136,867,000 |
| උක් පැටවුම් යන්ත්‍ර | 69,552,000 | - | | 69,552,000 |
| ක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ | 325,774,160 | - | - | 325,774,160 |
| | 585,838,160 | - | - | 585,838,160 |
| **කෙරීගෙන යන ඉදිකිරීම්** | | | | |
| ඉඩම් සංවර්ධන | 11,921,421 | 22,980,315 | - | 34,901,736 |
| අනෙකුත් ගොඩනැගිලි | 58,339,565 | 55,181,055 | - | 113,520,620 |
| ජෛව පොහොර කර්මාන්තශාලාව | 309,357,726 | 545,242,398 | (309,357,726) | 545,242,398 |
| ජෛව පොහොර කර්මාන්තශාලාව- යන්ත්‍රෝපකරණ | - | 807,829,638 | | 807,829,638 |
| කම්හල් පිරියත හා උපකරණ | 84,676,675 | 35,935,668 | (11,509,772) | 109,102,571 |
| හෝටල් ව්‍යාපෘතිය | 37,410,797 | - | - | 37,410,797 |
| කොම්පෝස් පිරියත | 1,897,609 | - | - | 1,897,609 |
| වාරිමාර්ග ව්‍යාපෘතිය | 15,969,604 | 2,996,648 | (5,020,925) | 13,945,327 |
| බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය | 2,008,690 | - | - | 2,008,690 |
| ERP ව්‍යාපෘතිය | - | 76,407,927 | - | 76,407,927 |
| | 521,582,087 | 1,546,573,649 | (325,888,423) | 1,742,267,313 |
| **කෙරීගෙන යන ඉදිකිරීම් - මූල්‍ය කල්බදු මත** | | | | |
| කම්හල් පිරියත හා උපකරණ | 120,750,000 | - | - | 120,750,000 |
| | 120,750,000 | - | - | 120,750,000 |
| මුළු ධාරණ වටිනාකම | 7,188,795,841 | 1,976,583,605 | (325,888,423) | 8,839,491,023 |

#### 10.2 ක්ෂය

| | 2023.01.01 දිනට ශේෂය රුපියල් | වර්ෂයට අයකිරීම් රුපියල් | අපහරණයන් රුපියල් | 2023.12.31 දිනට ශේෂය රුපියල් |
|---|---|---|---|---|
| ඉඩම් සංවර්ධනය | 85,308,018 | 3,936,757 | - | 89,244,775 |
| කම්හල් ගොඩනැගිලි | 174,251,679 | 5,476,710 | - | 179,728,389 |
| වෙනත් ගොඩනැගිලි | 146,593,738 | 7,136,008 | - | 153,729,746 |
| ක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ | 476,838,088 | 21,831,902 | - | 498,669,990 |
| වාරිමාර්ග හා විවිධ උපකරණ | 274,151,129 | 40,178,634 | - | 314,329,763 |
| කම්හල් පිරියත හා උපකරණ | 2,582,431,768 | 235,088,492 | - | 2,817,520,260 |
| වෙනත් පිරියත හා උපකරණ | 124,325,215 | 6,518,437 | - | 130,843,652 |
| ගබඩා ටැංකි | 40,581,015 | 2,967,660 | - | 43,548,675 |
| මාර්ග හා පාලම් | 110,287,086 | 1,205,594 | - | 111,492,680 |
| රසායනාගාර උපකරණ | 49,291,526 | - | - | 49,291,526 |
| මෝටර් වාහන | 192,470,725 | 11,678,634 | - | 204,149,359 |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | 172,607,794 | 17,238,274 | - | 189,846,068 |
| නිරවුල් කලාප පොදු පහසුකම් | 71,343,768 | 167,747 | - | 71,511,515 |
| | 4,500,481,549 | 353,424,849 | - | 4,853,906,398 |
| **මූල්‍ය කල්බදු වත්කම්** | | | | |
| මෝටර් වාහන | 51,350,333 | - | - | 51,350,333 |
| හොලන්ඩ් ට්‍රැක්ටර් | - | - | - | - |
| ට්‍රැක්ටර් | 37,556,419 | 23,964,501 | - | 61,520,920 |
| උක් පැටවුම් යන්ත්‍ර | 17,388,000 | 13,910,400 | - | 31,298,400 |
| ක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ | 146,456,200 | 53,965,048 | - | 200,421,248 |
| | 252,750,952 | 91,839,949 | - | 344,590,902 |
| මුළු ක්ෂය | 4,753,232,501 | 445,264,798 | - | 5,198,497,299 |

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

